# සිව්වැනි කොටස

# සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩකටයුතු හා මෙහෙයුම් වලට අදාල 1998 ප්‍රධාන නීති අණපනත්

පිටුව


| | | |
|---|---|---|
| 1. | 1998 අංක 6 දරන මුදල් නීති (සංශෝධන) පනත | I |
| 2. | 1998 අංක 11 දරන භාණ්ඩ හා සේවා බදු (සංශෝධන) පනත | II |
| 3. | 1998 අංක 17 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත | XII |
| 4. | 1998 අංක 22 දරන මුදල් (සංශෝධන) පනත | XIII |
| 5. | 1998 අංක 46 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත | XVI |
| 6. | 1998 අංක 47 දරන බදු සහ විදේශ විනිමය සමා පනත | XVIII |
| 7. | 1998 අංක 52 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | XXV |
| 8. | 1998 අංක 61 දරන විසර්ජන පනත | XLIV |
| 9. | 1998 අංක 63 දරන විසර්ජන (සංශෝධන) පනත | XLVII |

# 1998 අංක 6 දරන මුදල් නීති (සංශෝධන) පනත

[ සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 27 වන දින ]

## මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** මේ පනත 1998 අංක 6 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මුදල් නීති පනතේ 52 වන වගන්තියට ඉක්බිතිවම පහත දක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය එම වගන්තියේ 52අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:-

" අනුස්මරණ මුදල් නෝට්ටු හෝ කාසි නිකුත් කිරීම.

52අ. (1) (අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව සහ 53 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අනුස්මරණ මුදල් නෝට්ටු හෝ කාසි නිකුත් කරනු ලැබිය හැකිය.

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ නිකුත් කරනු ලබන අනුස්මරණ මුදල් නෝට්ටු හෝ කාසි, එම මුදල් නෝට්ටු හෝ කාසිවල දක්වෙන වටිනාකමට වඩා වැඩි වූ ද මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි වූ ද මිලකට විකුණනු ලැබිය හැකි ය.

(2) එවැනි අනුස්මරණ මුදල් නෝට්ටුවක හෝ කාසියක දක්වෙන වටිනාකමට වඩා වැඩි මිලකට (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන අනුස්මරණ මුදල් නෝට්ටුවක් හෝ කාසියක් විකුණනු ලැබීම 58අ වගන්තිය උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතුය.

(3) මේ වගන්තියෙහි "අනුස්මරණ මුදල් නෝට්ටුවක් හෝ කාසියක්" යන්නෙන්, යම් තැනැත්තකු හෝ විශේෂ සිද්ධියක් අනුස්මරණය කිරීම සඳහා නිකුත් කරනු ලබන මුදල් නෝට්ටුවක් හෝ කාසියක් අදහස් වේ."

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තිය 55 වන වගන්තියේ (1) වන උප වගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යෙදූ (1) වන උප වගන්තියෙහි "යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කිරීමේ දී" යන වචන වෙනුවට "(2) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කිරීමේ දී" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) නැවත අංක යෙදූ (1) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දක්වෙන උප වගන්තිය එකතු කිරීමෙන් :-

" (2) අවශ්‍ය මුදල් නෝට්ටුව හෝ කාසිය, එම මුදල් නෝට්ටුවේ හෝ කාසියේ දක්වෙන වටිනාකමකින් යුත් එකක් වන අවස්ථාවකදී, 52අ වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් අනුස්මරණ මුදල් නෝට්ටුවක් හෝ කාසියක් (1) වන උප වගන්තිය යටතේ ඉල්ලා සිටි විට බෙද හැරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත බැඳීමක් ඇති කරවන ලෙස (1) වන උප වගන්තියේ සඳහන් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය."

**4.** මේ පනතේ 2 වන හා 3 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1998 පෙබරවාරි මස 4 වන දින සිට බලාත්මක වන ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව 1998 පෙබරවාරි මස 4 වන දින හෝ එදිනට පසුව සහ මේ පනත පැනවීමට පෙර නිකුත් කරන ලද හෝ විකුණන ලද යම් අනුස්මරණ මුදල් නෝට්ටුවක් හෝ කාසියක් සියලු කාර්ය සඳහා නීත්‍යානුකූල ලෙස නිකුත් කරනු ලැබ ඇති හෝ විකුණන ලද ලෙස හා නිකුත් කරනු ලබන හෝ විකුණන ලද බවට සලකනු ලැබිය යුතු ය.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1998 අංක 11 දරන භාණ්ඩ හා සේවා බදු (සංශෝධන) පනත

[ සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 31 වන දින ]

## 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** මේ පනත 1998 අංක 11 දරන භාණ්ඩ හා සේවා බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ 2 වන වගන්තියේ (3) වන උප වගන්තිය වෙනුවට පහත දක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(3) භාණ්ඩ ආනයනය මත වූ බද්ද එය තීරු බද්දක් වූවාක් මෙන් ද ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සියලු භාණ්ඩ බද්දට හා තීරු බද්දට යටත් වූවාක් මෙන් ද පනවා අය කර ගත යුතු ය. මේ විධිවිධාන, රේගු ආඥාපනත ප්‍රකාර රේගු බන්ධිත ප්‍රදේශයට ඇතුළු කරන ලද යම් භාණ්ඩවලට අදාළ නොවිය යුතු ය;

එසේ වුවද භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා සහ ඒ නිෂ්පාදිත භාණ්ඩ අපනයනය සඳහා භාණ්ඩ අපනයනය කරන ලියාපදිංචි තැනැත්තකු විසින් හෝ 22 වන වගන්තියේ (6) වන උප වගන්තියේ සඳහන් වෙනත් යම් තැනැත්තකු විසින් ආනයනය කිරීම මත අයවිය යුතු බද්ද ගෙවීම, එසේ ආනයනය කළ භාණ්ඩ මත අයවිය යුතු බදු මුදල ආවරණය කරන, බැංකු ඇප වීමක් හෝ සංස්ථා ඇප වීමක් සැපයීමට යටත්ව, එම භාණ්ඩ ආනයනය කිරීමේ දිනයේ සිට දින හතලිස් පහක් නොඉක්මවන කාලසීමාවක් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබ, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් දින අනූවක් නොඉක්මවන වෙනත් කාලපරිච්ඡේදයක් සඳහා, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවලම්බනය කළ හැකි ය."

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (1) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන උප වගන්තිය ඇතුළත් කිරීමෙන් -

"(1අ)(1) වන උප වගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන කුමක් වුවද, සපයන ලද භාණ්ඩ සම්බන්ධයෙන් ඉන්වොයිස් පත්‍රයක් එම භාණ්ඩ භාර දීමේ දිනයෙන් දින දහයක් ඇතුළත නිකුත් කරන ලද අවස්ථාවක, එම භාණ්ඩ සැපයීමේ වේලාව ඉන්වොයිස් පත්‍රය නිකුත් කරන ලද වේලාව වශයෙන් සැලකිය යුතු ය." ;

(2) එම වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන උප වගන්තිය ඇතුළත් කිරීමෙන් -

"(2අ)(2) වන උප වගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන කුමක් වුව ද, එම සේවය ඉටු කිරීමේ දිනයෙන් දින දහයක් ඇතුළත ඉටු කරන ලද සේවා සම්බන්ධයෙන් ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කරනු ලබන අවස්ථාවක, එම සේවා සැපයීමේ වේලාව ඉන්වොයිස් පත්‍රය නිකුත් කළ වේලාව වශයෙන් සැලකිය යුතු ය." ;

(3) එම වගන්තියේ (3) වන උප වගන්තියේ (අ) ඡේදයේ "ගිවිසුමක් යටතේ" යන වචන වෙනුවට "නියමිත දින හෝ ඊට පසු ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එම වගන්තියේ (3) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් -

"(4) 23 වන වගන්තිය යටතේ ගෙවීමේ පදනමක් මත බද්ද සඳහා ගිණුම් ඉදිරිපත් කිරීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් ලියාපදිංචි තැනැත්තකුට විධාන කර ඇති අවස්ථාවක, එම තැනැත්තා විසින් සපයන ලද භාණ්ඩ හා සේවා සැපයීමේ වේලාව එම සැපයීම සම්බන්ධයෙන් ගෙවීම ලැබුණු වේලාව විය යුතු ය."

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (1) වන උප වගන්තියේ "මෙම පනත යටතේ අය කළ යුතු යම්කිසි බදු මුදලක්ද 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙවිය යුතු යම් නිෂ්පාදන බද්දක් සහ" යන වචන හා ඉලක්කම් වෙනුවට "මෙම පනත යටතේ අය කළ යුතු යම්කිසි බදු මුදලක් සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (5) වන උප වගන්තියේ (i) වන ඡේදයේ "ලියාපදිංචි අවලංගු කරන වේලාවේ දී තැනැත්තකු විසින් සපයන අවස්ථාවක" යන වචන වෙනුවට "ලියාපදිංචිය අවලංගු කරන වේලාවේදී තැනැත්තකු විසින් සපයන ලද අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (10) වන උප වගන්තියේ "අවස්ථාවෝචිත පරිදි ඒ ටිකට් පතට ගෙවූ මුදල හෝ ආපසු ගෙවිය යුතු යම් මුදලක් නොවන තැන්පත් කළ මුදල විය යුතුය" යන වචන වෙනුවට, "අවස්ථාවෝචිත පරිදි ඒ ටිකට් පතට ගෙවූ මුදලින් මේ පනත යටතේ ගෙවිය යුතු බද්ද අඩු කළ මුදල හෝ ආපසු ගෙවිය යුතු යම් මුදලක් නොවන තැන්පත් කළ මුදලින් මේ පනත යටතේ ගෙවිය යුතු බද්ද අඩු කළ මුදල විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) එම වගන්තියේ (10) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උප වගන්ති එකතු කිරීමෙන් :-

"(11) සමාලෝචනය කළ නොහැකි කුලී පින්නක්කර ගිවිසුමක් නොවන 1996 දෙසැම්බර් මස 23 වන දින හෝ ඊට පෙර ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ භාණ්ඩ හෝ සේවා සපයා ඇති අවස්ථාවක, එම සැපයීමේ වටිනාකම, එම ගිවිසුමේ නියමිත පරිදි එම සැපයුම සඳහා ප්‍රතිෂ්ඨාවෙන්, එම ප්‍රතිෂ්ඨාවට ආරෝපණය කළ හැකි බද්ද ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරන ලද බද්ද අඩු කළ මුදල විය යුතු ය.

(12) බදු ගිවිසුමක් යටතේ සපයන ලද යම් භාණ්ඩ බද්දේ කාලය ඉකුත් වූ විට එම බදු ගිවිසුමේ මුළු ප්‍රතිෂ්ඨාවෙන් සියයට දහයක් නොඉක්මවන ප්‍රතිෂ්ඨාවකට බදු ගැනුම්කරුට පසුව පැවරූ අවස්ථාවක එම ප්‍රතිෂ්ඨාව බදු ගිවිසුමේ ප්‍රතිෂ්ඨාවේ කොටසක් වශයෙන් සලකනු ලැබිය යුතු ය."

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයේ "භාණ්ඩ මත සෙස් බද්දක් ද ඇතුළුව" යන වචන වෙනුවට "භාණ්ඩ මත වූ යම් සෙස් බද්දක් ද 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙවිය යුතු යම් නිෂ්පාදන බද්දක් ද ඇතුළුව" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත් කිරීමෙන්.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම ඡේදයේ (iii) වන අනු ඡේදයේ "භාවිත කරන තාක් කල්," යන වචන වෙනුවට "භාවිත කරන තාක් කල්;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

"(iv) භාණ්ඩ හෝ මගීන් (ප්‍රතිනැව්ගත කිරීම ඇතුළුව) ජාත්‍යන්තර ප්‍රවාහනය".

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය එම වගන්තියේ (1) වන උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(අ) අවස්ථාවෝචිත පරිදි එක් මාසයක් හෝ මාස තුනක යම් බදු අය කළ හැකි කාලසීමාවක අවසානයේ දී ඔහුගේ බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුම් හෝ භාණ්ඩ සහ සේවා සැපයුම් අවස්ථාවෝචිත පරිදි එක් මාසයක හෝ මාස තුනක ඒ බදු අය කළ හැකි කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකාව තුළ සපයන ලද මුළු වටිනාකම රුපියල් පන් ලක්ෂය ඉක්මවා ඇත්නම්; හෝ

(ආ) එවකට අවසාන වන මාස දොළහක කාලසීමාව ඇතුළත ඔහුගේ බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුම් හෝ භාණ්ඩ සහ සේවා සැපයුම් ශ්‍රී ලංකාව තුළ සපයන ලද මුළු වටිනාකම රුපියල් එක් මිලියන අට ලක්ෂයක් ඉක්මවා ඇත්නම් : හෝ

(ඇ) අවස්ථාවෝචිත පරිදි ඊළඟට එන එක් මාසයක හෝ මාස තුනක බදු අය කළ හැකි කාලසීමාව තුළ ඔහුගේ බදු අය කළ හැකි ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හෝ සේවා සැපයුම හෝ භාණ්ඩ සහ සේවා සැපයුම්වල මුළු වටිනාකම රුපියල් ලක්ෂ පහක් ඉක්මවන බව හෝ ඉන් ඉක්බිතිව වූ මාස දොළහක කාලසීමාව තුළ එක් මිලියන අට ලක්ෂයක් ඉක්මවන බව විශ්වාස කිරීමට යම් අවස්ථාවක සාධාරණ හේතු ඇත්නම්

ඒ තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය :

කෙසේ වුවද භාණ්ඩ සැපයුම හුදෙකලා ගනුදෙනුවකට අදාළ වන බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, මේ වගන්තියේ කාර්යයන් සඳහා බදු අය කළ හැකි සැපයුම්වල මුළු වටිනාකම ගණන් බැලීමේ දී එම සැපයුමේ වටිනාකම බැහැර කළ හැකි ය."

**8**. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (1) වන උප වගන්තියේ අතුරු විධානයේ "10 වන වගන්තිය හෝ 12 වන වගන්තිය" යන වචන හා ඉලක්කම් වෙනුවට, "10 වන වගන්තිය හෝ 12 වන වගන්තිය හෝ 75 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ලියාපදිංචි වූ සේ සලකනු ලබන තැනැත්තකු" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (අ) ඡේදයේ "10 වන වගන්තිය හෝ 12 වන වගන්තිය" යන වචන හා ඉලක්කම් වෙනුවට, "10 වන වගන්තිය හෝ 12 වන වගන්තිය හෝ 75 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ලියාපදිංචි තැනැත්තකු වශයෙන් සලකනු ලබන තැනැත්තකු" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (3) වන උප වගන්තියේ "ප්‍රකටව පෙනෙන ලෙස" යන වචන වෙනුවට "ප්‍රකටව පෙනෙන ස්ථානයක" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**11**. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (1) වන උප වගන්තියෙහි "ලියාපදිංචි කිරීමේ දිනයෙන් පසුව" යන වචනවල සිට එම උප වගන්තියේ අවසානය දක්වා ඇති වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :-

"ලියාපදිංචි කිරීමේ දිනයෙන් පසුව වන මාස විසි හතරක කාලයක් අවසාන වීමෙන් පසුව කවර හෝ අවස්ථාවක ඔහුගේ ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය" යන වචන ආදේශ කිරීමෙන් :

(2) එම වගන්තියේ (3) වන උප වගන්තියෙහි "10 වන වගන්තියේ හෝ 12 වන වගන්තිය යටතේ ලියාපදිංචි යම් තැනැත්තකු" යන වචන හා ඉලක්කම් වෙනුවට "ලියාපදිංචි යම් තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන්.

**12**. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ "ඒ සැපයුම ලබන වෙනත් ලියාපදිංචි තැනැත්තකුට" යන වචන වෙනුවට "ඒ සැපයුම ලබන තැනැත්තාට" යන වචන ආදේශ කිරීමෙන් :

(2) ඒ වගන්තියේ (2) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:-

(අ) ඒ උප වගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) ඒ සැපයුම ලැබූ තැනැත්තාගේ නම හා ලිපිනය:" :

(ආ) ඒ උප වගන්තියේ (ඊ) ඡේදයේ "සැපයුමේ වටිනාකම 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙවිය යුතු යම් නිෂ්පාදන බදු ප්‍රමාණය 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත" යන වචන හා ඉලක්කම් ඉවත් කොට ඒ වෙනුවට "සැපයුමේ වටිනාකම, 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(3) ඒ වගන්තියේ (6) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් :-

"(6) 2 වන වගන්තියේ විධිවිධාන කුමක් වුවද ලියාපදිංචි තැනැත්තකු විසින් වටිනාකම රුපියල් දෙදහස නොඉක්මවන බදු අය කළ හැකි සැපයුමක් කරන අවස්ථාවක, ඒ ලියාපදිංචි තැනැත්තා විසින් පහත දැක්වෙන කරුණු දක්වෙන බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැක්කේ ය:-

(අ) සැපයුම්කරුගේ නම, ලිපිනය සහ ලියාපදිංචි අංකය :

(ආ) බදු ඉන්වොයිස් පත්‍රය නිකුත් කළ දිනය සහ එහි අනුක්‍රමික අංකය :

(ඇ) සැපයුමේ දිනය සහ සපයන ලද භාණ්ඩවල හෝ සේවාවේ විස්තරය :

(ඈ) සැපයුමේ ප්‍රමාණය හෝ ධාරිතාව;

(ඉ) සැපයුම් සඳහා වූ බද්ද ඇතුළුව ප්‍රතිෂ්ඨාව සහ අදාළ බදු අනුප්‍රමාණය.".

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ "දින පහළොවකට" යන වචන වෙනුවට "මාසයේ අවසාන දිනයට" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (12) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් :-

"(12) (10) වන උප වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් දණ්ඩනයක් පනවන ලද අවස්ථාවක හැර, (1) වන උප වගන්තියේ හෝ (3) වන උප වගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය හෝ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (2) වන උප වගන්තියේ "තමාගෙන් අය විය යුතු හිමැවුම් බද්දකින් අඩු කිරීමට ද ලියාපදිංචි තැනැත්තකුට හිමිකම ලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :-

"තමාගෙන් අය විය යුතු යම් නිමැවුම් බද්දකින් අඩු කිරීමට ද ලියාපදිංචි තැනැත්තකුට හිමිකම ලැබිය යුතු ය;

එසේ වුව ද, ගෙවීම් පදනම් කර ගත් ගිණුම්ගත කිරීමක් අනුගමනය කරන තැනැත්තකුට, මේ පනත යටතේ ඉඩ දෙනු ලැබිය හැකි ප්‍රමාණයට තමාගේ යෙදවුම් බද්ද මත බැර වාසියට හිමිකම් ලැබිය යුත්තේ ඒ තැනැත්තා විසින් ගෙවීමක් කර ඇති සැපයුමක් වෙනුවෙන් පමණක් විය යුතු ය.";

(2) ඒ වගන්තියේ (4) වන උප වගන්තියේ "මාස එකක් ගත වූ" යන වචන වෙනුවට "මාස දෙකක් ගත වූ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (4) වන උප වගන්තියේ අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :-

" එසේ වුව ද බදු අය කළ හැකි කාලසීමාවක -

(අ) ශූන්‍ය අනුප්‍රමාණගත සැපයුම්වල වටිනාකම ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා වූ බදු අය කළ හැකි මුළු සැපයුම් ප්‍රමාණයෙන් සියයට පණහකට අඩු නොවූ අවස්ථාවක, ශූන්‍ය අනු ප්‍රමාණගත සැපයුම, බදු අය කළ හැකි මුළු සැපයුම් ප්‍රමාණයට දරන අනුපාතයට සමාන අනුපාතයක් දරන, (පූර්ව බදු අය කළ හැකි කාලසීමාවකින් ඉදිරියට ගෙන ආ යම් අතිරික්තයක් ද ඇතුළුව) යෙදවුම් බද්දේ අතිරික්තයෙන් යම් කොටසක් ; හෝ

(ආ) මේ පනතේ උපලේඛනයේ (xxvii) හෝ (xxviii) විෂයාංකවල සඳහන් කාලය තුළ ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත් වී ඇති තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, යෙදවුම් බද්දෙහි අතිරික්තයක් වේ නම්, ඒ අතිරික්තය : හෝ

(ඇ) (6) වන උප වගන්තියේ සඳහන් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ බදු අය කළ හැකි කාලසීමාවේ යෙදවුම් බද්දෙහි අතිරික්තයක් වේ නම්, ඒ අතිරික්තය අවස්ථාවෝචිත පරිදි ඒ අතිරික්තයෙහි ඒ කොටස හෝ ඒ අතිරික්තය 58 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අතිරික්තය ඇති වූ බදු අය කළ හැකි කාලසීමාවේ අවසානයෙන් පසුව හෝ ඒ බදු අය කළ හැකි කාලසීමා සඳහා වූ වාර්තාව ලැබුණු දිනයෙන් පසුව යන දෙකින් පසුව ඇති වන සිදුවීමෙන් මාස එකකට වඩා පසු නොවී ආපසු ගෙවනු ලැබිය යුතුය. එම කාලසීමාව තුළදී ආපසු ගෙවීමට අපොහොසත් වූ අවස්ථාවක, ඒ ආපසු ගෙවීමට නියමිත දින සිට ඒ මුදල ගෙවනු ලබන දිනය දක්වා 59 වන වගන්තියෙන් නියම කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව වූ පොලියක් ද ගෙවනු ලැබිය යුතුය.

(4) ඒ වගන්තියේ (5) වන උප වගන්තියේ (i) වන ඡේදයේ "යම් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරන වාහන" යන වචන වෙනුවට "යම් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරන වාහන හෝ යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක යම් ව්‍යාපාර බඩු තොගයක කොටසක් වන්නා වූ යම් භාණ්ඩ හෝ මෝටර් රථයක් ප්‍රවාහනය කිරීම සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ වගන්තියේ (5) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උප වගන්ති එකතු කිරීමෙන් :-

"(6) යම් ලියාපදිංචි තැනැත්තකු විසින් තමා ශ්‍රී ලංකාවෙහි යම් ව්‍යාපාරයක් ආරම්භ කර ඇති බව සහ ඒ ආරම්භ කිරීමේ දිනයේ සිට මාස තිහක කාලයක් ඇතුළත දී ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් බදු අය කළ හැකි සැපයුමක් කිරීමට භාර ගන්නා බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන ආකාරයට සනාථ කර ඇති අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් යෙදවුම් බද්ද සඳහා බැර වාසි දීමට ඉඩ දෙනු ලැබිය හැකි ය.

(7) 33 වන වගන්තියේ විධිවිධාන කුමක් වුවද, නියමිත මුදලට වඩා අතිරික්ත වූ යම් ආපසු ගෙවීමක් හෝ යෙදවුම් බද්දේ ඉල්ලා සිටින යම් අතිරික්ත මුදලක් ආපසු ගෙවීම කරන ලද්දේ හෝ ඒ ඉල්ලීම කරන ලද්දේ කවර තැනැත්තකු විසින් ද ඒ ලියාපදිංචි තැනැත්තා විෂයයෙහි තක්සේරු කරුවකු විසින් තක්සේරු කරනු ලැබිය යුතු අතර, ඒ මුදල අවස්ථාවෝචිත පරිදි, ඒ ආපසු ගෙවීම හෝ යෙදවුම් බද්දේ අතිරික්තය ඇති වූ බදු අය කළ හැකි කාලසීමාවේ පළමුවන දිනයෙහි පැවති පැහැර හැරි බද්ද විය යුතු ලෙස සලකනු ලැබිය යුතු ය.".

**15**. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ "ලියාපදිංචි තැනැත්තකුට කරන ලද සැපයුමක්" යන වචන වෙනුවට "වෙනත් තැනැත්තකුට කරන ලද සැපයුමක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උප වගන්තියේ (ආ) ඡේදයේ "ලැබුම්කරු විසින්" යන වචන වෙනුවට "ලැබුම්කරු ලියාපදිංචි තැනැත්තකු වේ නම්, ඒ ලැබුම්කරු විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

**16**. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ "පහළොස්වන දිනට පසු දිනයක් නොවන" යන වචන වෙනුවට "අවසාන දිනයට පසු දිනයක් නොවන" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ ඇති අතුරු විධාන දෙකම ඉවත් කිරීමෙන්.

**17**. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයේ "පහළොස්වන" යන වචන ඇති සෑම තැනකම "අවසාන" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**18**. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ "බදු ගෙවීම මග හැරීම සඳහා" යන වචන වෙනුවට "බදු ගෙවීම මග හැරීම සඳහා හෝ සැපයුම, ආශ්‍රිත තැනැත්තන් අතර ගනුදෙනුවකට අදාළ වන අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**19**. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ " කාලසීමාවක් සඳහා යම් ලියාපදිංචි තැනැත්තකු විසින් වාර්තාවක් සපයා ඇති අවස්ථාවක" යන වචන වෙනුවට "කාලසීමාවක් සඳහා යම් ලියාපදිංචි තැනැත්තකු විසින් 21 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි වාර්තාවක් සපයා ඇති අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**20**. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ "ඒ පැහැර හැරීම සඳහා ඒ නිලධරයා වගකිව යුතු වුව ද නොවුව ද" යන වචන වෙනුවට "ඒ නිලධරයා විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයෙන් පටහැනි ලෙස ඔප්පු කර ඇත්තේ නම් මිස, ඒ නිලධරයා ඒ පැහැර හැරීම සඳහා වගකිව යුතු ලෙස" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන උප වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:-

"(2) සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් විසින්, යම් බද්දක් ගෙවිය යුතු දිනයේ දී හෝ ඊට පෙර ඒ බද්ද ගෙවා නොමැති අවස්ථාවක දී වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, ඒ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයේ යම් හවුල්කරුවකු හෝ නිලධරයකු විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන ආකාරයෙන් පටහැනි ලෙස ඔප්පු කර ඇත්තේ නම් මිස, ඒ හවුල්කරු හෝ නිලධරයා හෝ එකී පැහැර හැරීම සම්බන්ධයෙන් වග කිවයුතු ලෙස මේ පරිච්ඡේදයේ සියලු විධිවිධාන හෝ යම් විධිවිධානයක් හෝ යටතේ ඔහුට විරුද්ධව ක්‍රියා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.".

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තිය එහි (1) වන උප වගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යෙදූ (1) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන උප වගන්තිය එකතු කිරීමෙන් :-

"(2) සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් විසුරුවා හරිනු ලැබ ඇත්තාවූ ද, ඒ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු යම් බද්දක් අය කර ගැනීමට නොහැකිව ඇත්තාවූ ද අවස්ථාවක දී ඒ බද්ද ගෙවිය යුතුව තිබුණු කාල පරිච්ඡේදය තුළ යම් කාලයක දී ඒ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයේ හවුල්කරුවකුව හෝ නිලධරයකුව සිටි සෑම තැනැත්තකු ම, ඒ බද්ද ගෙවීම පැහැර හැරීම, ඒ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයේ කටයුතුවලට අදාළව තමන්ගේ යම් තදබල නොසැලකිල්ලකට, බලය අනිසි ලෙස පාවිච්චි කිරීමකට හෝ කාර්ය පැහැර හැරීමකට හෝ ආරෝපණය නොකළ හැකි බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ බද්ද ගෙවීමට සාමූහිකව හෝ වෙන් වෙන්ව යටත් වන්නේ ය. ".

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ අතුරු විධානයේ (i) වන සහ (ii) වන ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :-

" (i) ශූන්‍ය අනුප්‍රමාණගත සැපයුම් කරන ලියාපදිංචි තැනැත්තකුට ; හෝ

(ii) 22 වන වගන්තියේ (4) වන උප වගන්තියේ අතුරු විධානයේ (ආ) ඡේදයේ සඳහන් යම් ලියාපදිංචි තැනැත්තකුට; හෝ

(iii) 22 වන වගන්තියේ (6) වන උප වගන්තියේ සඳහන් යම් ලියාපදිංචි තැනැත්තකුට" ;

(2) ඒ වගන්තියේ (3) වන උප වගන්තියේ -

(අ) (අ) ඡේදයේ, "යම් බදු අය කළ හැකි කාලසීමාවක් හෝ බදු අය කළ හැකි කාලසීමාවක මාසයක්" යන වචන වෙනුවට, "බදු අය කළ හැකි යම් කාලසීමාවක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (ආ) ඡේදයේ, "බදු ගෙවිය හැකි යම් කාලසීමාවක් හෝ බදු ගෙවිය හැකි කාලසීමාවක යම් මාසයක් වෙනුවෙන් වූ වාර්තාවක් බදු අය කළ හැකි කාලසීමාවක හෝ බදු අය කළ හැකි කාලසීමාවක යම් මාසයක සපයා නොමැති අවස්ථාවක," යන වචන වෙනුවට, "බදු අය කළ හැකි යම් කාලසීමාවක් වෙනුවෙන් වූ වාර්තාවක් සපයා නොමැති අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන්.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියේ (1) වන උප වගන්තියේ "ගෙවනු ලැබිය යුතු ය" යන වචන ඉවත් කොට ඒ වෙනුවට, "ගෙවනු ලැබිය යුතු ය ;

එසේ වුවද, ලියාපදිංචි තැනැත්තාගේ යම් වාර්තාවක් සම්බන්ධයෙන් තක්සේරුකරු විසින් කරනු ලැබූ යම් නියමයක් අනුව ක්‍රියා කිරීම ඒ ලියාපදිංචි තැනැත්තා විසින් ප්‍රමාද කොට ඇති අවස්ථාවක දී එවැනි කිසිදු පොලියක් නොගෙවිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ XI වන පරිච්ඡේදය මෙයින් ඉවත් කරනු ලැබේ.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තියෙහි (ඊ) ඡේදය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**26**. ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ (4) වන උප වගන්තියේ, "නියෝජ්‍ය කොමසාරිස්වරයකු" යන වචන වෙනුවට, "නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**27**. ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ පිළිවෙළින් 71අ සහ 71ආ වගන්ති ලෙස බලපවත්වනු ලැබේ :-

"භාණ්ඩ හා සේවා බද්ද ආපසු ගෙවීමේ අරමුදල.

71අ. (1) භාණ්ඩ හා සේවා බද්ද ආපසු ගෙවීමේ (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ඒ අරමුදලට පහත දැක්වෙන මුදල් ප්‍රමාණ බැර කරනු ලැබිය යුතු ය :-

(අ) ඒ අරමුදලට ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතු රුපියල් මිලියන සියයක මුදලක් ගෙවනු ලැබිය යුතු ය;

(ආ) නියමිත දිනයෙන් ආරම්භ කර සෑම මාසයේ දී ම එකතු කරනු ලබන භාණ්ඩ හා සේවා බද්දෙන් සියයට විසිපහක්, ඒ මාසයෙන් පසුව එළඹෙන මාසයේ පසළොස්වන දින දී හෝ ඊට පෙර.

(3) මේ පනතේ විධිවිධානවලට අනුකූලව ගෙවිය යුතු සියලුම ආපසු ගෙවීම් ඒ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතුය.

(4) (i) කොමසාරිස් ජනරාල්වරයා හෝ, තත්කාර්යය සඳහා ඔහු විසින් ලිඛිතව බලය පවරනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකු හෝ විසින් අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(ii) ආපසු ගෙවීම් කළයුතු ආකාරය සහ ක්‍රමය සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

71ආ. යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්ද තක්සේරු කිරීමේ සහ ඒ තැනැත්තාගෙන් ඒ බද්ද එකතු කර ගැනීමේ ප්‍රතිඵලය ගෙන දෙන තොරතුරක් සපයන යම් පුද්ගලයකුට, අවස්ථානුගත කරුණු අනුව යුක්ති සහගත යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන මුදල් ප්‍රමාණ, තත් කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් විසර්ජනය කරන ලද මුදල් ප්‍රමාණ වලින් කොමසාරිස් ජනරාල්වරයා විසින් ගෙවනු ලැබිය හැකි ය" .

**28**. ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ, "රුපියල් ලක්ෂ දෙක ඉක්මවන" යන වචන වෙනුවට, "රුපියල් ලක්ෂ පහ ඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උප වගන්තියේ දැක්වෙන, "(1) වන උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා" යන වචන හා ඉලක්කම් වෙනුවට "නියමිත දිනයෙන් පසුව එළඹෙන ඕනෑම බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උප වගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(4) යම් ලියාපදිංචි තැනැත්තකු විසින් නියමිත දිනයට පෙර ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 12 වන වගන්තිය යටතේ පිරිවැටුම් බද්ද ගෙවා ඇති බව සහ මේ පනතේ 3 වන වගන්තිය යටතට නොගැනෙන බදු අය කළ හැකි සැපයුම් කිරීමේ දී නියමිත දිනයේ දී හෝ නියමිත දිනයට පසු හෝ ඒ තැනැත්තා විසින් ඒ භාණ්ඩ සපයන ලද බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලැබූ අවස්ථාවකදී, එසේ ගෙවනු ලැබූ පිරිවැටුම් බද්ද හෝ බදු අය කළ හැකි සැපයුමට ආරෝපණය කළ හැකි ඒ පිරිවැටුම් බද්දේ යම් කොටසක් හෝ හිලව් කර නොමැති නම් හෝ, 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 47, 48, 48අ සහ 48ආ යන වගන්ති යටතේ හිලව් කර නොමැති නම් හෝ, එකී පනතේ 49 වන වගන්තිය යටතේ ආපසු ගෙවා නොමැති නම්, ඒ පිරිවැටුම් බද්ද හෝ ඉන් කොටස හෝ 22 වන වගන්තියේ කාර්ය සඳහා යෙදවුම් බදු වාසියක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

**29**. ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි "තක්සේරුකරු" යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

"ආශ්‍රිත තැනැත්තන්" යන්නෙන් :-

(අ) එකම කොටස් හිමියන්ගෙන් සමන්විත වන්නා වූ හෝ එකම අධ්‍යක්ෂවරුන් විසින් කළමනාකරණය සහ පාලනය කරනු ලබන්නා වූ සමාගම් දෙකක් නැතහොත් ඊට වැඩි සංඛ්‍යාවක් ; හෝ

(ආ) යම් සමාගමක යම් කොටස් හිමියකු විසින් හෝ, ඒ කොටස් හිමියාගේ කලත්‍රයා හෝ දරුවකු හෝ භාරකරුවකු විසින් හෝ, ඒ කොටස් හිමියාගේ කලත්‍රයාගේ නැතහොත් දරුවාගේ යම් භාරකරුවකු විසින් හෝ, එක්ව නැතහොත් වෙන් වෙන්ව ඒ සමාගමේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට විසිපහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ ඒ සමාගමේ වෙන් කර දුන් කොටස්වල නාමික අගයෙන් සියයට විසිපහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ දරන්නේ ද එවැනි සමාගමක් හෝ කොටස් හිමියකු ; හෝ

(ඇ) යම් පුද්ගලයන් දෙදෙනකු අතුරින් එක් පුද්ගලයකු අනෙක් පුද්ගලයාගේ කලත්‍රයා හෝ දරුවකු හෝ එම කලත්‍රයාගේ නැතහොත් දරුවාගේ භාරකරුවකු වේ ද එවැනි පුද්ගලයන් දෙදෙනකු ; හෝ

(ඈ) හවුල් ව්‍යාපාරයක් සහ පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගලයා ඒ හවුල් ව්‍යාපාරයේ යම් හවුල්කරුවකුගේ ඥාතියකු වේ නම් එවැනි හවුල් ව්‍යාපාරයක් සහ පුද්ගලයකු ; හෝ

(ඉ) ඒකාබද්ධ ව්‍යවසායක් සහ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තා ඒ ඒකාබද්ධ ව්‍යවසායේ සාමාජිකයකුගේ ඥාතියකු වේ නම් එවැනි ඒකාබද්ධ ව්‍යවසායක් සහ තැනැත්තකු ; හෝ

(ඊ) යම් තැනැත්තන් දෙදෙනකු අතුරින් එක් තැනැත්තකු අනෙක් තැනැත්තාගේ භාරකරු වේ නම් එවැනි තැනැත්තන් දෙදෙනකු ; හෝ

(උ) එකිනෙකාට ඥාති සම්බන්ධයක් ඇති යම් තැනැත්තන් දෙදෙනකු අදහස් වේ.

(2) "විවෘත වෙළෙඳපොළ වටිනාකම" සහ "බදු අය කළ හැකි කාලසීමාව" යන අර්ථ නිරූපණ ඉවත් කොට ඒ වෙනුවට පිළිවෙළින් පහත දැක්වෙන අර්ථ නිරූපණ ආදේශ කිරීමෙන් :-

"විවෘත වෙළෙඳපොළ වටිනාකම" යන්න, යම් දිනයක කරන ලද භාණ්ඩ හෝ සේවා හෝ සැපයුමක වටිනාකම සම්බන්ධයෙන් යෙදී ඇති විට, නිදහසේ අර්පණය කරන ලද්ද වූ ද ආශ්‍රිත තැනැත්තන් නොවන තැනැත්තන් අතර සපයන ලද්ද වූ ද ඉහත කී භාණ්ඩ හෝ සේවා සැපයුමට සමාන සැපයුමක්, ඒ හා සමාන පරිවේෂණ යටතේ ශ්‍රී ලංකාවේ දී සපයන ලද්දේ නම් ඒ සැපයුම සඳහා සාමාන්‍යයෙන් ලබා ගත හැකි ප්‍රතිෂ්ඨාවට සමාන වන්නා වූ ප්‍රතිෂ්ඨාවකින් 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත යටතේ ගෙවිය යුතු ජාතික ආරක්ෂක බද්ද අඩු කළවිට ලැබෙන ප්‍රතිෂ්ඨාව අදහස් වේ.

" බදු අය කළ හැකි කාලසීමාව" යන්නෙන්, -

(අ) (i) යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි සැපයුම්වල වටිනාකම, පූර්වයෙන් වූ මාස දෙළහ ඇතුළතදී රුපියල් මිලියන තිහක් ඉක්මවා ඇති අවස්ථාවකදී ; හෝ

(ii) ඊළඟට එළඹෙන මාස දෙළහක කාලපරිච්ඡේදය තුළ දී යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි සැපයුම්වල වටිනාකම රුපියල් මිලියන තිහ ඉක්මවන්නේ යයි ඇස්තමේන්තු කර ඇති අවස්ථාවක දී ; හෝ

(iii) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ යම් තැනැත්තකුගේ මුළු පිරිවැටුම, නියමිත දිනයට මාස හයකට පෙරාතුව අවසන් වූ අනුගාමී කාර්තු හතර තුළ දී රුපියල් මිලියන තිහක් ඉක්මවා ඇති අවස්ථාවක දී ; හෝ

(iv ) යම් තැනැත්තකු විසින් ශූන්‍ය අනුප්‍රමාණගතකළ සැපයුම් කරනු ලබන අවස්ථාවක දී ; හෝ

(v) උප ලේඛනයෙහි (xxvii) වන හෝ (xxviii) වන විෂයයන්හි සඳහන් පරිදි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ යම් තැනැත්තකු ගිවිසුමකට එළඹ ඇති අවස්ථාවක දී ; හෝ

(vi) යම් තැනැත්තකු විසින් ව්‍යාපාරයක් ආරම්භ කොට 22 වන වගන්තියේ (6) වන උප වගන්තියේ නියමයන්ට අනුකූල වීමට භාරගත් අවස්ථාවක දී

එක් මාසයක කාලසීමාවක් අදහස් වේ.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් නොවන තැනැත්තකු හෝ ශූන්‍ය අනුප්‍රමාණගත කළ සැපයුම් කරන්නාවූ ද කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමතිය මත කාර්තුවක් පාසා වාර්තා ඉදිරිපත් කිරීමට එකඟ වන්නාවූ ද තැනැත්තකු වන ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වනවිට එක් එක් වර්ෂයේ පිළිවෙළින් ජනවාරි මාසයේ පළමුවන දිනයෙන්, අප්‍රේල් මාසයේ පළමුවන දිනයෙන්, ජූලි මාසයේ පළමුවන දිනයෙන් සහ ඔක්තෝබර් මාසයේ පළමුවන දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලසීමාවක් අදහස් වේ.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපලේඛනයේ (i) වන විෂයයෙහි, "පොල්, කපාපු පොල්, පොල් කෙඳි, පොල් පුන්නක්කු, කොප්පරා, රබර්" යන වචන වෙනුවට "පොල්, කපාපු පොල්, පොල් පුන්නක්කු, සැකසුම් නොකළ වන සම්පත් නිෂ්පාදන සැපයීම හෝ ආනයනය කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපලේඛනයේ (ii) වන විෂයයෙහි, " මිරිස් ආනයනය කිරීම" යන වචන වෙනුවට "මිරිස් සැපයුම හෝ ආනයනය කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපලේඛනයේ (iv) වන විෂයය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් :-

"(iv) කවර ආකාරයකින් හෝ හඳුන්වනු ලබන පාන් වර්ග සැපයුම හෝ ආනයනය කිරීම" ;

(4) ඒ උපලේඛනයේ (vi) වන විෂයයෙහි "සැපයුම" යන වචනය වෙනුවට, "සැපයුම හෝ ආනයනය කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ උපලේඛනයේ (xii) වන විෂයයෙහි, "පෙට්‍රෝලියම් ගෑස් ද්‍රාවනය" යන වචන වෙනුවට, "පෙට්‍රෝලියම් ගෑස් ද්‍රාවනය සහ පෙට්රල්" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) ඒ උපලේඛනයේ (xv) වන විෂයයෙහි, "ආනයනය කිරීම" යන වචන වෙනුවට, "සැපයුම හෝ ආනයනය කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(7) ඒ උපලේඛනයේ (xix) වන විෂයයෙහි, "ජනරජයේ ආණ්ඩුවට" යන වචන වෙනුවට, "ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුවට හෝ පළාත් සභාවකට" යන වචන ආදේශ කිරීමෙන් ;

(8) ඒ උපලේඛනයේ (xxii) වන විෂයයෙහි, "සැපයුම" යන වචනය වෙනුවට, "සැපයුම හෝ ආනයනය කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(9) ඒ උපලේඛනයේ (xxv) වන විෂයය ඉවත් කිරීමෙන් ;

(10) ඒ උපලේඛනයේ (xxvi) වන විෂයයෙහි, "කිලෝ වොට් පැය 75" යන වචන හා ඉලක්කම් වෙනුවට, "කිලෝ වොට් පැය 90" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(11) ඒ උපලේඛනයේ (xxix) වන විෂයය ඉවත් කිරීමෙන් ;

(12) ඒ උපලේඛනයේ (xxx) වන විෂයය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් :-

"(xxx) නියමිත දින හෝ එයට පෙර, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ගිවිසුමකට එළඹ ඇති සහ එම ගිවිසුමට අදාළ ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 50 ක් හෝ ඒ හා සමාන මුදලකට නොඅඩු වන සමාගමකට, 1979 අංක 28 දරන දේශීය ආදයම් පනතේ අර්ථානුකූලව නිර්වාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ වාස්තු විද්‍යාත්මක, ඉංජිනේරුමය, ප්‍රධාන සමීක්ෂක හෝ ඉදිකිරීම් කළමනාකරණ සේවා සැපයීම" ;

(13) ඒ උපලේඛනයේ අගට පහත දැක්වෙන විෂයයන් එකතු කිරීමෙන් :-

"(xxxii) පදිංචිය සඳහා ඉඩ පහසුකම් සැපයීම, බදු දීම හෝ කුලියට දීම ;

(xxxiii) දව ආනයනය කිරීම හෝ සැපයීම ;

(xxxiv) වෛද්‍ය ආයතන විසින් හෝ වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් තැනැත්තන් විසින් හෝ සියලු සෞඛ්‍යාරක්ෂක සේවා සැපයීම;

(xxxv) නියමිත දිනෙන් ආරම්භ වන දෙවර්ෂයක කාලසීමාව තුළදී සංචාරකයන්ට හෝටල්වල ඉඩ පහසුකම් සැපයීම" ;

(xxxvi) 1996 අංක 19 දරන ශ්‍රී ලංකා සංචාරක මණ්ඩල පනත මගින් පිහිටුවන ලද සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වූ සංචාරක නියෝජිතයන් විසින්, නියමිත දිනෙන් ආරම්භ වන දෙවර්ෂයක කාලසීමාව තුළදී සංචාරකයන්ට අභ්‍යන්තර සේවා සැපයීම;

(xxxvii) මුතු, දියමන්ති, ස්වාභාවික හෝ කෘතිම මැණික් ගල් හෝ බාල වර්ගයේ මැණික් ගල්, දියමන්ති සහ වෙනත් කුඩු වර්ග, මහඟු ලෝහ හෝ මහඟු ලෝහ කැවූ ලෝහ වර්ග සහ රන් කාසි ආනයනය කිරීම හෝ සැපයීම;

(xxxviii) යන්ත්‍රෝපකරණ, වෛද්‍ය සහ දන්ත වෛද්‍ය උපකරණ සහ සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා ගිලන් රථ ද ඇතුළුව, වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය උපකරණ, ආම්පන්න සහ උපාංග ආනයනය කිරීම හෝ සැපයීම.” .

**31**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

# 1998 අංක 17 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත

[ සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 09 වන දින ]

## 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** මේ පනත 1998 අංක 17 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 1998 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

**2.** 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "මුදල් කටයුතු කර ගෙන යන" යන වචන වෙනුවට, "මුදල් කටයුතු කර ගෙන යන ; හෝ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තිය අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-
"(ඈ) විදුලි සංදේශ සේවා සලසන ව්‍යාපාරය කර ගෙන යන."

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුව හොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

# 1998 අංක 22 දරන මුදල් (සංශෝධන) පනත

[ සහතිකය සටහන් කළේ 1998 මැයි මස 15 වන දින ]

## 1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** මේ පනත 1998 අංක 22 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන, 1963 අංක 11 දරන මුදල් පනතේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"ගිණුම් විගණනය

11. රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව, මණ්ඩලයේ අරමුදලේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය."

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"ජාතික ලොතරැයි

14. (1) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා ලොතරැයි පවත්වනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, මණ්ඩලය වෙනුවෙන්, වෙනත් යම් තැනැත්තකු විසින් ලොතරැයි පැවැත්වීම පිණිස, මණ්ඩලය විසින් ඒ වෙනත් තැනැත්තකු සමග ගිවිසුම්වලට ඇතුළත් විය හැකි ය.

(3) තත් කාර්යය සඳහා නිකුත් කරන බලපත්‍රයක් මගින්, මණ්ඩලය විසින් මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, වෙනත් යම් තැනැත්තකු විසින් ලොතරැයි පවත්වනු ලැබීමට බලය දෙනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් පවත්වනු ලබන හෝ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ මණ්ඩලය වෙනුවෙන් පවත්වනු ලබන හෝ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ පවත්වනු ලබන සෑම ලොතරැයියක් ම මේ පනතේ මේ කොටස යටතේ "ජාතික ලොතරැයියක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 14අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:-

"14අ වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක නියම හා කොන්දේසි ආදිය.

14අ. (1) මණ්ඩලය විසින් 14 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන සෑම බලපත්‍රයක් ම, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(2) 14 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් වෙනුවෙන් ම, නියමිත යම් මුදල් ප්‍රමාණයකින් වූ ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය. බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින්, ඒ ගාස්තුව මණ්ඩලයට ගෙවනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් එය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) 14 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නා, ඒ බලපත්‍රය යටතේ වන නියම හෝ කොන්දේසි කිසිවක් අනුව හෝ මේ පනතේ යම් විධිවිධානයක් අනුව හෝ ක්‍රියා කිරීම පැහැර හැරියහොත්, මණ්ඩලය විසින් ඒ බලපත්‍රය අවලංගු කිරීම නීත්‍යානුකූල විය යුතු ය." .

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ යෙදෙන "පවත්වනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට "පවත්වනු නොලැබිය යුතු ය; නැතහොත් පැවැත්වීමට බලය දෙනු නොලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(1) ජාතික ලොතරැයියකින් ප්‍රදානය කරනු ලබන ත්‍යාග සංඛ්‍යාව සහ ඒ එක් එක් ත්‍යාගයේ වටිනාකම-

(අ) මණ්ඩලය විසින් පවත්වනු ලබන ලොතරැයියක් සම්බන්ධයෙන් වන විට, නියමිත පරිදි විය යුතු ය;

(ආ) 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ මණ්ඩලය වෙනුවෙන් පවත්වනු ලබන ලොතරැයියක් සම්බන්ධයෙන් වන විට, ඒ ගිවිසුමෙහි සඳහන් පරිදි විය යුතු ය ;

(ඇ) 14 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ පවත්වනු ලබන ලොතරැයියක් සම්බන්ධයෙන් වන විට, ඒ බලපත්‍රයේ නියම හා කොන්දේසිවල සඳහන් පරිදි විය යුතු ය" .

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(3) සෑම ලොතරැයියක ම ත්‍යාග ජයග්‍රාහකයන් -

(අ) මණ්ඩලය විසින් පවත්වනු ලබන ලොතරැයියක් සම්බන්ධයෙන් වන විට, නියමිත යම් ආකාරයකට ;

(ආ) 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ මණ්ඩලය වෙනුවෙන් පවත්වනු ලබන ලොතරැයියක් සම්බන්ධයෙන් වන විට, ඒ ගිවිසුමෙහි සඳහන් යම් ආකාරයකට ;

(ඇ) 14 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ පවත්වනු ලබන ලොතරැයියක් සම්බන්ධයෙන් වන විට, ඒ බලපත්‍රයේ නියම හා කොන්දේසිවල සඳහන් යම් ආකාරයකට

නිශ්චය කරනු ලැබිය යුතු ය" .

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ -

(අ) "ඒ ත්‍යාග සඳහා නොම්මර ඇදීමේ දිනයේ" යන වචන වෙනුවට "ජයග්‍රාහකයන් නිශ්චය කරනු ලැබූ දිනයේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "මණ්ඩලය විසින් ඒ ත්‍යාගය ප්‍රදානය කරනු ලැබිය යුතු ය" යන වචන වෙනුවට, අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලය විසින් හෝ මණ්ඩලය වෙනුවෙන් ඒ ජාතික ලොතරැයිය පවත්වන තැනැත්තා විසින් හෝ 14 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ ඒ ජාතික ලොතරැයිය පවත්වන තැනැත්තා විසින් හෝ ඒ ත්‍යාගය ප්‍රදානය කරනු ලැබිය යුතු ය". යන වචන ආදේශ කිරීමෙන්.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ, "සෑම ජාතික ලොතරැයියකින් ම" යන වචන වෙනුවට "මණ්ඩලය විසින් පවත්වනු ලබන සෑම ජාතික ලොතරැයියකින් ම" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

(1අ) මණ්ඩලය විසින් පවත්වනු ලබන ජාතික ලොතරැයියක මුදලින් සංයුක්ත වන ත්‍යාගයක් කිසිම තැනැත්තකු විසින් දිනාගනු නොලැබූ අවස්ථාවක, මේ වගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ ත්‍යාග මුදල, ත්‍යාග සංචිත ගිණුමකට බැර කරනු ලැබිය යුතු අතර, ඒ ගිණුමේ එකතුවන මුදල්, මණ්ඩලය විසින් පසුව පවත්වනු ලබන ජාතික ලොතරැයිවල ත්‍යාග ප්‍රදානය සඳහා යොද ගනු ලැබිය යුතු ය".

(3) ඒ වගන්තියේ (2) උපවගන්තියේ "ස්ථිර ලේකම්වරයා විසින් අනුමත කරන ලද" යන වචන වෙනුවට "අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරන ලද" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තිය අගට පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :-

(3) මණ්ඩලය විසින් 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ මණ්ඩලය වෙනුවෙන් පවත්වනු ලබන සෑම ජාතික ලොතරැයියකින් ම ලැබෙන මුදල, ඒ මුදලින් ඒ ජාතික ලොතරැයියේ ප්‍රදානය කරන ත්‍යාගවල වටිනාකම සහ ඒ ජාතික ලොතරැයිය පවත්වාගෙන යන තැනැත්තාට ඒ ගිවිසුමෙහි නියම යටතේ ගෙවිය යුතු කළමනාකරණ ගාස්තු සහ (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ඈ) සහ (ඉ) ඡේදවල සඳහන් යම් ගෙවීම් හා බැරකම් පියවීමේ කාර්ය සඳහා අවශ්‍ය බවට ලේකම්වරයා අනුමත කරන මුදල් ප්‍රමාණයක් අඩුකොට, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින්, ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(4) ජාතික ලොතරැයියක දී අහිමි කරනු ලැබ 16 වන වගන්තිය යටතේ මණ්ඩලයේ අරමුදලට ගෙවනු ලැබූ සියලු ත්‍යාග මුදල්, මණ්ඩලය විසින් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) "මුදල් වර්ෂය" යන්නෙහි අර්ථ කථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

"මුදල් වර්ෂය" යන්නෙන්, යම් වර්ෂයක ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව අදහස් වේ" ; තවද

(2) "අමාත්‍යවරයා" යන්නෙහි අර්ථ කථනය ඉවත් කොට , ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

"අමාත්‍යවරයා" යන්නෙන් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ.

**10**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1998 අංක 46 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

[ සහතිකය සටහන් කළේ 1998 අගෝස්තු මස 31 වන දින ]

## 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1**. මේ පනත 1998 අංක 46 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2**. (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 2 වන වගන්තියේ (ආ) ඡේදය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදය ඉවත් කිරීමෙන් ; සහ

(ආ) ඒ ඡේදයේ (iv ) වන අනුඡේදය එහි (iii) වන අනුඡේදය ලෙස නැවත අංක කිරීමෙන්.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (i) වන අනුඡේදයෙහි " සියයට විසිපහකින්" යන වචන වෙනුවට "සියයට දහයකින්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තිය අගට පහත දක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ,-

"(6) සිනමා චිත්‍රපටි ප්‍රදර්ශනය කිරීමේ යම් ව්‍යාපාරයක යම් කාර්තුවක් සඳහා වූ පිරිවැටුම නිසැකව දනගැනීමේ දී, 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපටි සංස්ථා පනතේ 5 වන වගන්තිය හා 61 වන වගන්තිය යටතේ සාදනු ලැබ, 1996 ඔක්තෝබර් මස 24 වන දින අංක 946/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝගවල 2 වන නියෝගයේ අර්ථානුකූලව එකතු කර ගන්නා ලද යම් "වැඩිවීමකට" සමාන මුදලක්, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඒ කාර්තුව සඳහා අඩු කරනු ලැබිය යුතු ය."

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් භාණ්ඩයක් ආනයනය කරන සෑම තැනැත්තකු-ගෙන් ම" යන වචන වෙනුවට" 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත ක්‍රියාත්මක මූ දිනයට පෙරාතුව, යම් භාණ්ඩයක් ආනයනය කරන සෑම තැනැත්තකුගෙන් ම" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ;

(2) ඒ උපවගන්තිය අගට, පහත දක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :-

"(2) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, (1) වන උපවගන්තියෙහි විධිවිධානවලට අනුකූලව, අවසාන කාර්තුවට ඉහතින් වූ එක් එක් කාර්තුව සඳහා අඩු කළ හැකි පිරිවැටුම් බද්දේ යම් ශේෂයක් ඉතිරිව ඇති අවස්ථාවක, ඒ ශේෂය, (1) වන උපවගන්තියෙහි සඳහන් පිරිවැටුම මත අවසාන කාර්තුව සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන්, අඩු කළ හැකි ප්‍රමාණයට අඩු කළ යුතු අතර, එසේ අඩු කිරීමෙන් පසු ඒ ශේෂයේ යම් ඉතිරියක් 49 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට ගණන් ගනු ලබන මාස හයක කාලයක් ඉකුත් වීමෙන් පසුව ආපසු ගෙවනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා " අවසාන කාර්තුව " යන්නෙන්, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත ක්‍රියාත්මක වීමේ දිනයට ඉහතින් ම වූ දිනයෙන් අවසන් වන කාර්තුව අදහස් වේ.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන, 2 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් ව්‍යාපාරයකට අදාළ නොවිය යුතු ය".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ අගට, පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :-

"(2) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, (1) වන උපවගන්තියෙහි විධිවිධානවලට අනුකූලව, අවසාන කාර්තුවට ඉහතින් වූ එක් එක් කාර්තුව සඳහා අඩු කළ හැකි පිරිවැටුම් බද්දේ යම් ශේෂයක් ඉතිරිව ඇති අවස්ථාවක, ඒ ශේෂය, (1) වන උපවගන්තියෙහි සඳහන් පිරිවැටුම සම්බන්ධයෙන් අවසාන කාර්තුව සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන්, අඩු කළ හැකි ප්‍රමාණයට අඩු කළ යුතු අතර, එසේ අඩු කිරීමෙන් පසු ඒ ශේෂයේ යම් ඉතිරියක් 49 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට ගණන් ගනු ලබන මාස හයක කාලයක් ඉකුත් වීමෙන් පසුව ආපසු ගෙවනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා "අවසාන කාර්තුව" යන්නෙන්, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත ක්‍රියාත්මක වීමේ දිනයට ඉහතින් ම වූ දිනයෙන් අවසන් වන කාර්තුව අදහස් වේ.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන, 2 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් ව්‍යාපාරයකට අදාළ නොවිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ සාදනු ලැබූ 1995 මැයි මස 1 වන දින අංක 869/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝගයේ 1 වන කොටසේ 3 වන තීරයේ දක්වා ඇති සටහනෙහි විස්තරයට අයත් වන යම් භාණ්ඩයක සාදන්නකු හෝ ආනයනයකරුවකු වශයෙන් ව්‍යාපාරය පවත්වා ගෙන ගිය යම් තැනැත්තකුගේ පිරිවැටුම් සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ ද, ඒ නියෝගයේ ඒ කොටසේ 2 වන තීරයේ දක්වා ඇති ශීර්ෂ අංක 84 යටතේ වූ සං.ව. සංකේත අංක 8424.81 ට අදාළ සටහනට අනුරූප වූ ද, පිරිවැටුම් බදු අනුප්‍රමාණය ඒ පනතේ ඒ වගන්තිය යටතේ සාදනු ලැබ 1993 ජනවාරි මස 29 වන දින අංක 751/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නියෝගයේ පටහැනිව කුමක් සඳහන් වුවද -

(i) 1993 ජනවාරි මස 29 වන දිනයෙන් ආරම්භව 1995 පෙබරවාරි මස 7 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට පහක් ; සහ

(ii) 1995 පෙබරවාරි මස 8 වන දිනයෙන් ආරම්භව 1995 අප්‍රේල් මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට හයක් විය යුතු ය.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය යටතේ සාදන ලද නියෝගයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඇඟළුම් අපනයනය කිරීමේ යෙදී සිටින යම් ව්‍යාපාරයක් සඳහා,

(i) අමු රෙදි නිම කරන ලද රෙදි බවට පරිවර්තනය කිරීමෙහි ලා ; හෝ

(ii) රසායනික සේදීම් මගින් හෝ ඩයි වර්ග යෙදීමෙන් හෝ එම්බ්‍රොයිඩර් කිරීමෙන්, සිහින් රැලි දැමීමෙන් හෝ සලන මුද්‍රණයෙන් ඇඟළුම්වල තත්ත්වය හා ස්වභාවය දියුණු කිරීමෙහි ලා

සේවා සපයන සෑම ව්‍යාපාරයක් ම 1992 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත් 1995 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා සහ 1995 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භව 1995 නොවැම්බර් මස 8 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා පිරිවැටුම් බද්දෙන් නිදහස් කරනු ලැබූ ලෙස සහ නිදහස් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට -

(අ) මේ පනතේ 3 (1) වන වගන්තියෙන් කරන ලද සංශෝධනය, සියලු කාර්ය සඳහා 1997 නොවැම්බර් මස 6 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) මේ පනතේ 3(2) වන වගන්තියෙන් කරන ලද සංශෝධනය, සියලු කාර්ය සඳහා, 1997 ජූලි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1998 අංක 47 දරන බදු සහ විදේශ විනිමය සමා පනත

[ සහතිකය සටහන් කළේ 1998 සැප්තැම්බර් මස 14 වන දින ]

**ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත රඳවාගෙන ඇති සමුච්චිත ලාභ සහ ආදායම නියෝජනය කරන්නා වූ ද, තැනැත්තකු විසින් ආදායම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර නොමැත්තා වූ හෝ ආදායම් බදු පැනවීමට අදාළ නීතිය යටතේ එ ' තැනැත්තා විසින් සැපයිය යුතු වාර්තාවක හෙළිදරව් කර නොමැත්තා වූද මුදල් හෝ යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත රඳවාගෙන ඇති අදාළ විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද ඇතැම් සමාගම්වල ආයෝජනය කිරීමට හෝ යම් බැංකුවක තැන්පත් කිරීමට හැකිවීම සඳහා ද, එවැනි තැන්පතු මත බදු ගෙවීමට තැනැත්තන්ගේ වගකීම ඉටු කිරීම සඳහා ඇතැම් බදු ගෙවීමට ඇති වගකීම සම්බන්ධයෙන් සහ එවැනි බදු නීති හෝ විනිමය පාලන නීති සම්බන්ධයෙන් නඩු පැවරීම්වලින් හෝ දණ්ඩනවලින් තැනැත්තන් වගකීමෙන් නිදහස් කිරීම සඳහා ද එම බදු නීති හෝ විනිමය පාලන නීති සම්බන්ධයෙන් වූ වැරදිවලට එම තැනැත්තන් අනාගතයේ දී බදු නීති, විනිමය පාලනයට අදාළ නීති සම්පූර්ණයෙන් පිළිපැදීම සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව හා ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම ද පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 1998 අංක 47 දරන බදු සහ විදේශ විනිමය සමා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) (2) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව මේ පනත -

(අ) ආදායම් බදු පැනවීමට අදාළව තත් කාලයෙහි බලපවත්නා නීතිය යටතේ 1996 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර ලැබුණු හෝ උපචිත වූ යම් ලාභ සහ ආදායම වෙනුවෙන්, 1996 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු හෝ ආදායම් බදු මත අධිභාරයක් ගෙවීමට යටත් වන එකී යම් තක්සේරු වර්ෂයක් සඳහා එම නීතියේ විධිවිධාන යටතේ ආදායම් වාර්තාවක් සපයා නොමැත්තා වූ හෝ එකී යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ පනතේ විධිවිධාන යටතේ තමා විසින් සපයන ලද යම් වාර්තාවක එම ලාභ හෝ ආදායම හෙළිදරව් කිරීම පැහැර හැර ඇත්තා වූ ; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් අදාළ විදේශ ව්‍යවහාර මුදල් දරන්නා වූ

යම් තැනැත්තකුට අදාළ විය යුතු ය.

(2) මේ පනත -

(අ) 1996 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර තමාට ලැබුණු හෝ උපචිත වූ හෝ ව්‍යුත්පන්න වූ, අවස්ථාවෝචිත පරිදි, යම් ලාභ සහ ආදායම හෝ පිරිවැටුම් සම්බන්ධයෙන් ආදායම් බදු පැනවීමට තත් කාලයෙහි අදාළ නීතිය හෝ 1963 අංක 11 දරන මුදල් පනත හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත හෝ 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත යටතේ ගෙවිය යුතු යම් බද්දක් මග හරිනු ලැබුවේ යයි කියනු ලැබීමක් හෝ සැක කරනු ලැබීමක් ; හෝ

(ආ) විනිමය පාලන පනතේ හෝ 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කළේ යයි කියනු ලැබීමක් හෝ සැක කරනු ලැබීමක්

පිළිබඳව යම් විමර්ශනයක් 1997 නොවැම්බර් මස 6 වන දින විමර්ශනය වෙමින් පවතින්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට අදාළ නොවිය යුතු ය.

3. (1) මේ පනත අදාළ වන්නා වූ ද -

(අ) අදාළ මුදල් කිසිවක් ඇත්තා වූ ; හෝ

(ආ) අදාළ විදේශ ව්‍යවහාර මුදල් කිසිවක් දරන්නා වූ ද යම් තැනැත්තකු විසින්-

(i) ඒ අදාළ මුදල් හෝ අදාළ විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීමෙන් ලබා ගත් මුදල්, 1997 නොවැම්බර් මස 5 වන දිනට පසුව, එහෙත් 1999 ජුනි මස 30 වන දින හෝ එදිනට පෙර, යම් නිශ්චිත ව්‍යවසායක පමණක් යෙදී ඇති යම් සමාගමක, පවත්නා කොටසක් නොවන යම් කොටසක් මිල දී ගැනීමේ ලා ආයෝජනය කරනු ලැබිය හැකි ය ;

(ii) ඒ අදාළ මුදල් හෝ අදාළ විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීමෙන් ලබා ගත් මුදල්, 1997 නොවැම්බර් මස 5 වන දිනට පසුව, එහෙත් 1998 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර, යම් බැංකුවක තැන්පත් කර, එසේ තැන්පත් කරන ලද මුදල් වලින් සියයට පහළොවකට සමාන (මේ පනතේ මෙහි මින් මතු 'සමා බද්ද' යනුවෙන් සඳහන් කරනු ලබන) මුදල් ප්‍රමාණයක් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවනු ලැබිය යුතුය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "නිශ්චිත ව්‍යවසාය" යන්නෙන් -

(i) විද්‍යුත් නිෂ්පාදිත නිෂ්පාදනය කිරීම හෝ විද්‍යුත් නිෂ්පාදනවල කොටස් එකලස් කිරීම හෝ විද්‍යුත් නිෂ්පාදනවල කොටස් නිෂ්පාදනය කිරීම;

(ii) පිඟන් මැටි නිෂ්පාදන හෝ වීදුරු භාණ්ඩ නිෂ්පාදනය;

(iii) ශ්‍රී ලංකාවේ නිපදවූ රබර් උපයෝගී කරගෙන රබර් නිෂ්පාදන නිෂ්පාදනය කිරීම;

(iv) ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම;

(v) මැණික් හෝ දියමන්ති කැපීම සහ ඔප දැමීම;

(vi) සැහැල්ලු හෝ බර ඉංජිනේරු කර්මාන්තය;

(vii) නිවාස ඉදිකිරීම සහ විකිණීම; හෝ

(viii) පුරෝගාමී ස්වභාවයක වූ කර්මාන්තයක් හෝ සේවාවක් වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් නම් කර ඇති යම් භාණ්ඩ හෝ බඩු නිෂ්පාදනය කිරීම හෝ යම් සේවාවක් සැපයීම කරන්නා වූ ද

1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමකට එළැඹ ඇත්තේ යම් සමාගමක් සමඟ ද එවැනි සමාගමක් වූ ද යම් සමාගමක් අදහස් වේ.

**4.** මේ පනත අදාළ වන්නා වූ ද -

(අ) 3(1) (i) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් ආයෝජනයක් කර ඇති ; හෝ

(ආ) 3(1) (ii) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් තැන්පතුවක් කර ඒ මත සමා බද්දක් ගෙවා ඇති

**5.** වන වගන්තියේ සඳහන් අදාළ ප්‍රකාශය කර ඇත්තා වූ ද යම් තැනැත්තකු -

(අ) (i) 3(1) (i) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ආයෝජනය කරන ලද මුදල් වලින් හෝ 3(1) (ii) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව තැන්පත් කරන ලද හා ඒ සම්බන්ධයෙන් සමා බද්දක් ගෙවා ඇති, මුදල් වලින් දක්වෙන, ඔහුගේ ලාභ සහ ආදායමේ යම් කොටසක් මත 1996 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර හෝ අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, අවස්ථාවෝචිත පරිදි, ආදායම් බදු පැනවීමට තත් කාලයෙහි අදාළ නීතිය යටතේ හෝ ආදායම් බද්ද මත අධිභාරය පැනවීමට තත්කාලයෙහි අදාළ නීතිය යටතේ, පිළිවෙළින් යම් ආදායම් බද්දක් හෝ ආදායම් බද්ද මත අධිභාරයක් ගෙවීමට යටත් නොවිය යුතු ය;

(ii) (i) වන අනුඡේදයෙහි සඳහන් ඔහුගේ ලාභ සහ ආදායමේ යම් කොටසක් උපයෝජනය කිරීම මගින් අත්කර ගන්නා ලද ඔහුගේ ශුද්ධ ධනයේ කොටස වෙනුවෙන් ධන බද්ද පැනවීමට තත් කාලයෙහි අදාළ නීතිය යටතේ හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට තත් කාලයේ අදාළ නීතිය යටතේ 1992 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු, පිළිවෙළින් යම් ධන බද්දක් හෝ ධන බද්ද මත අධිභාරයක් ගෙවීමට යටත් නොවිය යුතු ය;

(iii) (i) වන අනුඡේදයෙහි සඳහන් ඔහුගේ ලාභ සහ ආදායමේ කොටස උපචිත වූයේ නැතහොත් පැන-නැගුනේ පිරිවැටුමක යම් කොටසකින්ද, ඒ පිරිවැටුමේ කොටස වෙනුවෙන් 1963 අංක 11 දරන මුදල් පනත යටතේ යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ යම් පිරිවැටුම් බද්දක් හෝ 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත යටතේ යම් ජාතික ආරක්ෂක බද්දක් ගෙවීමට යටත් නොවිය යුතු ය ; හෝ

(ආ) (i) (අ) ඡේදයේ (i) වන අනුඡේදයෙහි සඳහන් ඔහුගේ ලාභ සහ ආදායමේ කොටස හෝ (අ) ඡේදයේ (ii) වන අනුඡේදයෙහි සඳහන් ඔහුගේ ශුද්ධ ධනයේ කොටස වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් 1996 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයකට අදාළ ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට තත් කාලයෙහි අදාළ නීතිය යටතේ යම් වරදක් සඳහා අධි චෝදනාවකට හෝ දණ්ඩනයකට යටත් නොවිය යුතු ය;

(ii) (අ) ඡේදයේ (iii) වන අනුඡේදයෙහි සඳහන් ඔහුගේ පිරිවැටුමේ කොටස වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් 1963 අංක 11 දරන මුදල් පනත හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත හෝ 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත යටතේ යම් නඩු පැවරීමකට හෝ දණ්ඩනයකට යටත් නොවිය යුතු ය;

(iii) යම් අදාළ විදේශ මුදලක් පරිවර්තනය කිරීමෙන් ලබා ගත් මුදලින් සංයුක්ත වන එසේ ආයෝජනය කරන ලද හෝ තැන්පත් කරන ලද මුදල්වල කොටස සම්බන්ධයෙන් විනිමය පාලන පනත යටතේ නඩු පැවරීමකට හෝ දණ්ඩනයකට යටත් නොවිය යුතු ය.

**5**. (1) 3(I) (i) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව මුදල් ආයෝජනය කරන හෝ 3(I) (ii) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව මුදල් තැන්පත් කරන සහ ඒ මත සමා බද්ද ගෙවන යම් තැනැත්තකු විසින් මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති අදාළ ආකෘති පත්‍රයේ කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රකාශයක් කරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් ප්‍රකාශයකින් එම ආයෝජනය හෝ තැන්පතුව සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් හෝ යම් අදාළ විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනයෙන් ලබා ගත් මුදලින් සංයුක්ත වන බව හෙළි වන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ ප්‍රකාශයේ පිටපතක් විනිමය පාලකවරයාට යැවීමට සැලැස්විය යුතුය.

**6**. මේ පනතේ ඉහතින් වූ විධිවිධානවල ඇතුළත් කිසිවකින්-

(අ) (i) ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත වූ අධිභාරය හෝ ධන බද්ද හෝ ධන බද්ද මත වූ අධිභාරය පැනවීමට අදාළ තත් කාලයෙහි බලපවත්වන නීතිවල ; හෝ

(ii) 1963 අංක 11 දරන මුදල් පනතෙහි හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ හෝ 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනතේ

විධිවිධාන යටතේ කරන ලද, එවැනි යම් නීතියක් හෝ පනතක් යටතේ ; හෝ

(ආ) මේ පනත අදාළ වන යම් තැනැත්තකු මත, ඔහු විසින් විනිමය පාලන පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීමට අදාළව, 1996 මාර්තු මස 31 වන දිනට පෙර පනවන ලද, එවැනි යම් නීතියක් යටතේ ; හෝ

(ඇ) වෙනත් යම් කාරණයක් යටතේ කර ඇති හා එවැනි යම් නීතියක් යටතේ අවසානාත්මකව හා තීරණාත්මකව ඇති යම් තක්සේරුවක්

ප්‍රතිශෝධනය කිරීමට බලය ලැබෙන්නේ යයි කියවා තේරුම් ගනු නොලැබිය යුතු ය.

**7**. වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනත අදාළ වන යම් තැනැත්තකු විසින් 3(1) (i) වන වගන්තියේ විධිවිධාන අනුව කරන ලද යම් ආයෝජනයක් සම්බන්ධයෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 30 වන වගන්තියේ කාර්ය සඳහා අඩුකිරීම්වලට ඉඩ නොදෙනු ලැබිය යුතු ය.

**8**. (1) (2) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, විනිමය පාලන දෙපාර්තමේන්තුවේ සහ සෑම බැංකුවකම නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් ම, මේ පනත පරිපාලනය කිරීමෙහි දී තමන්ට දැනගන්නට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් මේ පනත යටතේ ස්වකීය යුතුකම් ඉටු කිරීමේ දී හැර, රහස්‍යතාව රැකීම හා රහස්‍යතාව රැකීමෙහි ලා ආධාර කිරීම කළ යුතු අතර, 3 වන වගන්තියේ සඳහන් එවැනි යම් ආයෝජනයක් හෝ තැන්පතුවක් පිළිබඳව කවර වූ හෝ තොරතුරක්, යම් පුද්ගලයකුට, සංස්ථාවකට, බැංකුවකට, අධිකරණයකට, ආයතනයකට, ආස්ථිතයකට, දෙපාර්තමේන්තුවකට, නිලධරයකුට, අනුයෝජිතයකුට, ශ්‍රී ලංකා ආණ්ඩුවේ නියෝජිතයකුට හෝ වෙනත් යම් නෛතික හෝ ස්වභාවික තැනැත්තකුට දීම, හෙළි කිරීම හෝ අනාවරණය කිරීම, නොකළ යුතුය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, මේ පනත පරිපාලනය කිරීමෙහි දී තමන්ට දැන ගන්නට ලැබෙන යම් කාරණයක් හෝ තොරතුරක් දන්වන ලෙස, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයාට, විනිමය පාලකවරයාට හෝ යම් බැංකුවකට -

(i) ඒ කාරණය හෝ තොරතුර අදාළ වන තැනැත්තා විසින් ;

(ii) යම් අධිකරණයක, විෂ මත්ද්‍රව්‍ය හෝ සංක්‍රාන්ත වන වාහනයක් හෝ ගුවන් යානයක් පැහැරගෙන යාම හෝ පිළිබඳ වූ ජාත්‍යන්තර සම්මුතියක් ක්‍රියාවේ යෙදවීමේ යම් නීතියක් යටතේ පවරනු ලැබ ඇති යම් අපරාධ නඩු කටයුත්තක දී ඒ නීතියෙහි යම් විධිවිධානයක් මහින් ;

(iii) ආදායම් බදු පැනවීමට තත් කාලයේ අදළ නීතිය යටතේ ශ්‍රී ලංකාව විසින් ගිවිසුමට අනුකූලව ආදායම මත ද්විත්ව බදු අය කිරීම වැළැක්වීමට යම් ගිවිසුමකට එළඹ ඇති යම් රටක නිසි බලධරයා විසින් ;

(iv ) 3 වන වගන්තියේ සඳහන් යම් ආයෝජනයකින් හෝ තැන්පතුවකින් නියෝජනය වන මුදල් හෝ විදේශ විනිමය 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ වරදක් සමන්විත කළ යම් ක්‍රියාවක් තවදුරටත් කරගෙන යාම පිණිස, යොද ගෙන ඇති බවට හා දනටත් යොද ගන්නා බවට වූ හේතුව මත, ඒ සඳහා වූ ඉල්ලීමක් පිට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලබන ආඥවක් මහින්

නියම කරනු ලබන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා හෝ විනිමය පාලකවරයා විසින් හෝ බැංකුව විසින්, ඒ කාරණය හෝ තොරතුර දන්වීම, ඒ නියමයට හෝ අධිකරණ ආඥවට අනුකූල වීම සඳහා තදින්ම අවශ්‍ය වනතාක් දුරට ඒ කාරණය හෝ තොරතුර ඒ තැනැත්තා හෝ අධිකරණය වෙත දන්වනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව ක්‍රියා කරන, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ හෝ යම් බැංකුවක යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු, මේ පනත යටතේ වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගතකරනු ලැබීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගතකිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

**9**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**10**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

"බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍ර ලත් හෝ බලපත්‍ර ලැබූ ලෙස සලකනු ලබන යම් වාණිජ බැංකුවක් හෝ 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත මහින් පිහිටුවනු ලැබූ ජාතික ඉතිරි කිරීමේ බැංකුව අදහස් වේ ;

"කොමසාරිස් ජනරාල්වරයා" , "ශුද්ධ ධනය" , "ලාභ සහ ආදායම්" සහ "තක්සේරු වර්ෂය" යන යෙදුම්වලට 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතෙහි ඒවාට පිළිවෙළින් දී ඇති අර්ථ ම ඇත්තේ ය ;

"ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනත මහින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අදහස් වේ ;

"විනිමය පාලකවරයා" යන්නෙන්, මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා වශයෙන් පදවිනාම ගත කර ඇති නිලධරයා අදහස් වන අතර, ඔහුගේ සහායකයා වශයෙන් පදවිනාම ගත කර ඇති නිලධරයෙක් ද එයට ඇතුළත් වේ ;

" විදේශ විනිමය පනත" යන්නෙන්, (423 වන අධිකාරය වන) විනිමය පාලන පනත අදහස් වේ ;

"විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන්, ශ්‍රී ලංකා ව්‍යවහාර මුදල් හැර යම් ව්‍යවහාර මුදල් වර්ගයක් අදහස් වන අතර, යම් තැනැත්තකුගේ විශ්‍රාම වැටුප හෝ ඔහුට ලැබිය යුතු වෙනත් ඒ හා සමාන ගෙවීමක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිටින හෝ ශ්‍රී ලංකාවෙහි පදිංචිව සිටින තැනැත්තකුට විදේශීය ආණ්ඩුවක් හෝ ආයතනයක් විසින් ගෙවිය යුතු යම් ව්‍යවහාර මුදල් වර්ගයක් සහ ශ්‍රී ලංකා ව්‍යවහාර මුදලින් හැර වෙනත් යම් ව්‍යවහාර

මුදලකින් ගෙවිය යුතු සියලු තැන්පතු, ණයවර හා ශේෂයන්ද, ශ්‍රී ලංකා ව්‍යවහාර මුදලින් ප්‍රකාශ කර ඇති හෝ ලියා ඇති නමුත් ශ්‍රී ලංකා ව්‍යවහාර මුදලින් හැර වෙනත් යම් ව්‍යවහාර මුදලින් ගෙවිය යුතු එවැනි යම් අණකර, සංචාරක චෙක්පත්, ණයවර ලිපි සහ විනිමය බිල්පත් එයට ඇතුළත් වේ ;

"මැණික්" යන්නෙන්, 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ අර්ථානුකූල වූ මැණිකක් අදහස් වේ ;

"ස්වර්ණාභරණ" යන්නෙන්, 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරි පනතේ අර්ථානුකූලව ස්වර්ණාභරණ අදහස් වේ ;

"තැනැත්තා" යන්නට සමාගමක්, පුද්ගල මණ්ඩලයක් හෝ හවුල් ව්‍යාපාරයක් ඇතුළත් වේ ;

"අදාළ විදේශ ව්‍යවහාර මුදල්" යන්න, යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ තැනැත්තා විසින් විනිමය පාලන පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවෙන් පිටතදී 1996 මාර්තු මස 31 වන දින දරන ලද්ද වූ ද, ලාභ සහ ආදායම් වන හෝ ලාභ සහ ආදායමට ආරෝපණය කළ හැකි නැතහොත් ලාභ සහ ආදායම නොවන හෝ ලාභ සහ ආදායමට ආරෝපණය කළ හැකි නොවන ත්‍යාග, ප්‍රදාන හෝ උරුම වීම මඟින් හෝ වෙනත් කවර හෝ ක්‍රමයකින් ශ්‍රී ලංකාවෙන් පිටත දී හෝ ඔහු විසින් අත් කරගෙන ඇත්තාවූ ද, විදේශ ව්‍යවහාර මුදල් අදහස් වේ ;

"අදාළ මුදල්" යන්න යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට එම තැනැත්තා විසින් 1996 මාර්තු මස 31 වන දින ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත දී දරනු ලැබුවා වූ ද (අදළ විදේශ ව්‍යවහාර මුදල් නොවන්නා වූ ද) 1996 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයක උපචිත වූ ලාභ උද්ගත වූ හෝ උපචිත වූ හෝ ලබා ගත් ආදායම නියෝජනය කරන්නා වූ ද, ඒ සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් ආදායම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර නැත්තා වූ හෝ ආදායම් බද්ද පැනවීමට තත් කාලයෙහි අදළ වන නීතියයටතේ ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන යම් ආදායම් වාර්තාවක අනාවරණය කර නැත්තා වූ ද, යම් මුදලක් අදහස් වේ ;

"ආදායම් බදු පැනවීමට තත් කාලයෙහි අදළ නීතිය" යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත අදහස් වේ ;

"ආදායම් බද්ද මත අධිභාරය පැනවීමට තත් කාලයෙහි අදළ නීතිය" යන්නෙන්, 1982 අංක 26 දරන ආදායම් බදු අධිභාර පනත, 1984 අංක 12 දරන ආදායම් බදු අධිභාර පනත සහ 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනත අදහස් වේ ;

"ධන බද්ද පැනවීමට හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට තත් කාලයෙහි අදළ නීතිය" යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත, 1982 අංක 25 දරන ධන බදු අධිභාර පනත සහ 1989 අංක 8 දරන ධන බදු අධිභාර පනත අදහස් වේ ;

"පිරිවැටුම" හා "කාර්තුව" යන යෙදුම්වල 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතෙහි ඒවාට පිළිවෙළින් දී ඇති අර්ථ ම ඇත්තේ ය.

## උපලේඛනය (5 වන වගන්තිය)

I වන කොටස - කොටස්වල ආයෝජනය කරන තැනැත්තන් විසින්
ඉදිරිපත් කිරීම සඳහා

1998 අංක 47 දරන බදු සහ විදේශ විනිමය සමා පනත

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

ආදායම් බදු ලිපිගොනු (තිබේ නම්) අංකය :-

පිරිවැටුම් බදු ලිපිගොනු (තිබේ නම්) අංකය :-

ජාතික හැඳුනුම්පත් අංකය (පුද්ගලයකු නම්) :-

සමාගමේ/හවුල් ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය :-

.................................................................................................................................................... (ලිපිනය) හි පදිංචි

.................................................................................................................................................... (සම්පූර්ණ නම/නම්)

මහතා/මහත්මිය/මෙනවිය වන සහ .......................................................................... (සමාගමේ හෝ හවුල් ව්‍යාපාරයේ

නම) හි ..................................................................... (නිල නාමය) වන මම/අපි 1998 අංක ................................ දරන

බදු සහ විදේශ විනිමය සමා පනත අනුව සම්පූර්ණයෙන්

(i) මා/අප විසින්/සමාගම විසින්/හවුල් ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකාවේ දරන වෙනත් මුදල් වන රු. ........................ කින්

(ii) අදාළ විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනයෙන් ලබා ගත් රු. ................................ කින් සමන්විත වන රු........................... (රු................................) ක මුදලක්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් නිශ්චිත ව්‍යවසායක් වශයෙන් හඳුනාගෙන ඇත්තා වූද, 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ....................................... දින අංක ................................ දරන ගිවිසුමට ඇතුළත් වී ඇත්තා වූ ද සමාගමක් වන ........................................................... හි (පවත්නා කොටස් හැර) කොටස් ........................... ක් ................................ දින මිලදී ගැනීමෙහි ලා ආයෝජනය කර ඇති බව ප්‍රකාශ කරමි/කරමු.

ප්‍රකාශකරුගේ/ප්‍රකාශකරුවන්ගේ/
අත්සන/අත්සන්.

ප්‍රකාශය, පුද්ගලයකු වශයෙන් නොවන අවස්ථාවකදී, නිල නාමය.

දිනය :-

II වන කොටස - බැංකුවල මුදල් තැන්පත් කරන තැනැත්තන් විසින්
ඉදිරිපත් කිරීම සඳහා

1998 අංක 47 දරන බදු සහ විදේශ විනිමය සමා පනත

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

ආදායම් බදු ලිපිගොනු (තිබේ නම්) අංකය :-

පිරිවැටුම් බදු ලිපිගොනු (තිබේ නම්) අංකය :-

ජාතික හැඳුනුම්පත් අංකය (පුද්ගලයකු නම්) :-

සමාගමේ/හවුල් ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය :-

.................................................................................................................................................... (ලිපිනය) හි

............................................................................................................................................ (සම්පූර්ණ නම/නම්)

මහතා/මහත්මිය/මෙනවිය වන සහ ......................................................................... (සමාගමේ හෝ හවුල් ව්‍යාපාරයේ නම)

හි ............................................................................................ (නිල නාමය) වන මම/අපි 1998 අංක 47 දරන බදු සහ විදේශ විනිමය සමා පනත අනුව සම්පූර්ණයෙන්

(i) මා විසින්/සමාගම විසින්/හවුල් ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකාවේ දරන වෙනත් මුදල් වන රු. .................................... කින්

(ii) අදාළ විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනයෙන් ලබා ගත් රු. ............................. කින් සමන්විත වන රුපියල් .......................... (රු.........................) ක මුදලක්, ............................................................................ හි ........................................ ශාඛාවේ අංක .................................. දරන මගේ/අපගේ/සමාගමේ ගිණුමේ තැන්පත් කළ බවත් මා/අප විසින් ඒ මත පනතේ 3 වන වගන්තිය අනුව බදු ගෙවා ඇති බවත් ප්‍රකාශ කරමි/කරමු.

*තැන්පත්කරුගේ/කරුවන්ගේ*
*අත්සන/අත්සන්.*

ප්‍රකාශය, පුද්ගලයකු වශයෙන් නොවන අවස්ථාවකදී, නිල නාමය.

දිනය :-

# 1998 අංක 52 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[ සහතිකය සටහන් කළේ 1998 නොවැම්බර් මස 24 වෙනි දින ]

## 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** මේ පනත 1998 අංක 52 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** 1997 අංක 24 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (අ) ඡේදයෙහි -

(අ) (xxiv අ) අනුඡේදයේ "1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා," යන වචන හා ඉලක්කම් වෙනුවට " 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සහ 1997 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භව 1997 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා," යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) (LXXiii) අනුඡේදයේ "ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ලාභ සහ ආදායම්." යන වචන වෙනුවට "ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ලාභ සහ ආදායම්; " ; යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) (LXXiii) අනුඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

"(LXXiv) 1997 අංක 28 දරන බණ්ඩාරනායක කෞතුකාගාර කමිටුව (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවන ලද බණ්ඩාරනායක කෞතුකාගාර කමිටුවේ ලාභ සහ ආදායම්." ;

"(LXXV) 1992 අංක 33 දරන පතල් හා ඛණිජ පනත යටතේ පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය";.

(2) ඒ වගන්තියේ (ඉ) ඡේදයේ -

"(ii) අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත්නම්, ඒ ව්‍යවසායේ ලාභ හා ආදායම;" යන වචන වෙනුවට (II) අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත්නම්, ඒ ව්‍යවසායේ ලාභ හා ආදායම යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තිය අගට පහත දක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

"(ඊ) (i) 1996 දෙසැම්බර් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ කරන ලද යම් ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ලාභ හා ආදායම්වලින් සියයට හැත්තෑවකට අඩු නොවන ප්‍රමාණයක් එහි ඒකක හිමියන්ට ඒ තක්සේරු වර්ෂය අවසානයේ සිට එක් අවුරුද්දක් ඉකුත්වීමට ප්‍රථම බෙද හරින්නේ නම්, ඒ ඒකක භාරයේ හෝ අන්‍යොන්‍ය අරමුදලේ ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ලාභ හා ආදායම් ;

(ii) යම් ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක අවුරුදු හතක කාලසීමාව අවසන් වන්නේ 22ඈඈඈඈ වගන්තියේ සඳහන් කවර තක්සේරු වර්ෂයක් අවසානයේ දී ද ඒ තක්සේරු වර්ෂයේ අවසාන දිනයට ඉක්බිතිව ම එළඹෙන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ඒ ඒකක භාරයේ හෝ අන්‍යොන්‍ය අරමුදලේ ලාභ හා ආදායම්වලින් සියයට හැත්තෑවකට අඩු නොවන ප්‍රමාණයක් ඒ ඒකක හිමියන්ට ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට එක් අවුරුද්දක් ඉකුත්වීමට ප්‍රථම බෙද හරින්නේ නම්, ඒ ඒකක භාරයේ හෝ අන්‍යොන්‍ය අරමුදලේ ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ලාභ හා ආදායම්;" .

**3**. 1997 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (ඊ)ඡේදයේ (viii) වන අනුඡේදයේ " ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදල විසින්" යන වචන වෙනුවට " ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදල විසින් හෝ ශ්‍රී ලංකාවේ කාර්මික සහයෝගිතාව සලස්වනු ලබන එහි වැඩසටහනක දී පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය විසින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ච) ඡේදයේ " සේවාකාලයට ආරෝපණය කරනු ලබන යම් මුදල් කොටසක් ; සහ" යන වචන වෙනුවට " සේවා කාලයට ආරෝපණය කරනු ලබන යම් මුදල් කොටසක්;" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියේ (ජ) ඡේදයෙහි " සේවා කාලයට ආරෝපණය කළ හැකි කොටස.". යන වචන වෙනුවට "සේවා කාලයට ආරෝපණය කළ හැකි කොටස ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ උපවගන්තියේ (ජ) ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ට) යම් සේවා නියුක්තයකුගේ සේවා යෝජක විසින් -

(i) කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව, ඒ සේවා යෝජක විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන සියළු සේවා නියුක්තයින්ට ඒකාකාරව අදළ වන යෝජනා ක්‍රමයන්ට අනුකූලව 1997 නොවැම්බර් මස 6 වැනි දින හෝ එදිනට පසුව ඒ සේවා නියුක්තයා විසින් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ ;

(ii) කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රමයකට අනුකූලව ඒ සේවා යෝජක විසින් 1997 නොවැම්බර් මස 6 වන දින හෝ එදිනට පසුව ඒ සේවා නියුක්තයා සේවා නියුක්තියෙන් ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ධූරය හෝ සේවා නියුක්තිය අහිමිවීම වෙනුවෙන් වන්දි වශයෙන් ඒ සේවා නියුක්තිකයාගේ සේවා යෝජක විසින් ඒ සේවා නියුක්තිකයාට ගෙවනු ලබන මුදල ;

**4**. 1997 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (උ) ඡේදයෙහි "බැරට ඇති මුදල් මත ඔහුට උපචිත වන පොලිය." යන වචන වෙනුවට "බැරට ඇති මුදල් මත ඔහුට උපචිත වන පොලිය; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

" (ඌ) ආණ්ඩුවේ යම් ව්‍යවසායයීය සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවන ලද යම් අවදනම් ප්‍රාග්ධන සමාගමකට යම් මූල්‍ය ආයතනයක් විසින් ප්‍රදනය කරන ලද යම් ණයකින් ලැබෙන මුදල් ඒ සමාගම විසින් ඒ වැඩසටහන සඳහා යොදවා ඇති නම්, ඒ ණය වෙනුවෙන් ඊට උපචිත වන පොලිය :

මේ ඡේදයේ කාර්ය සඳහා" මූල්‍ය ආයතනය" යන්නෙන්, තැන්පතු මාර්ගයෙන් නැතහොත් ණයකර හෝ බැඳුම්කර හෝ වෙනත් යම් ආකාරයකින් වූ ණය මාර්ගයෙන් මුදල් භාර ගැනීමෙන් ස්වකීය ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් හෝ සමන්විත වන සහ ඒ මත පොලිය ගෙවන සමාගමක් අදහස් වේ".

**5**. 1997 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (අඅ) ඡේදයට ඉක්බිතිව ම, පහත දක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :-

"(අඅඅ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ යම් ගිවිසුමකට එළඹ ඇති සමාගමක් විසින්, ගෙවන හා නොගෙවන රෝගීන් උදෙසා අභ්‍යන්තර හා බාහිර ප්‍රතිකාර සඳහා පහසුකම් සහිත රෝහලක් පවත්වාගෙන යාමෙන් ඒ සමාගමට ලැබෙන ලාභවලින්, ඒ රෝහලේ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ තක්සේරු වර්ෂයෙන් ආරම්භව ගණන් බැලූ අවුරුදු පහක කාලයක් ඇතුළත ගෙවනු ලැබූ යම් ලාභාංශ ;

(අඅඅඅ) (i) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමකට ඇතුළත් වී ඇත්තා වූ ද ;

(ii) 1992 අංක 33 දරන පතල් සහ ඛනිජ පනත යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ඒ සමාගම වෙත පවරා දී ඇත්තා වූ ද ;

සමාගමක, 1998 මාර්තු 19 වන දිනැති අංක 1019/13 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නියෝග මගින් අවසන්වරට සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩලය පනතේ 24 වන වගන්තිය යටතේ සාදන ලද 1995 අංක 1 දරන නියෝගවල 2 වන නියෝගයේ (iv) වන ඡේදයේ තවදුරටත් වූ අතුරු විධානයේ (අ) අනුඡේදයට අනුව තීරණය කරනු ලබන අනුප්‍රමාණයක් අනුව, එහි ලාභ සහ ආදායමින් ආදායම් බදු අයකළයුතු වන කාලසීමාව තුල හෝ ඉන් පසු එක් වර්ෂයක් තුළ එහි 3(අ) වගන්තියේ අර්ථානුකූලව වූ ලාභ වලින් ගෙවන ලද යම් ලාභයක් ;"

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි " 17 ඔඔ, 18 වන" යන අකුරු හා ඉලක්කම් වෙනුවට " 17ඔඔ, 17ඕ, 17ක, 18 වන" යන අකුරු හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**6**. 1997 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි (xxi) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

" (xxii) ශ්‍රී ලංකා සුරැකුම් පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් පළ කරනු ලබන යම් නිල ලැයිස්තුවක ස්වකීය කොටස් 1999 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර නිල ලැයිස්තු ගත කර ඇති සමාගමක් වන යම් සමාගමක කොටස් දරන යම් තැනැත්තකු විසින් 1997 නොවැම්බර් මස 6 වන දින හෝ ඊට පසුව එහෙත් 1999 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව එකී කොටස් විකිණීමෙන් ;

(xxiii) යම් සමාගමක් විසින් නිකුත් කරනු ලැබ, යම් තැනැත්තකු විසින් දරනු ලබන්නා වූ ද, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් පළකරනු ලබන යම් නිල ලැයිස්තුවක විකුණන අවස්ථාව වනවිට නිල ලැයිස්තු ගත කරනු ලැබ ඇත්තා වූ ද යම් බැඳුම්කරයක්, ණයකරයක් හෝ වෙනත් ණය සාධන පත්‍රයක් 1997 නොවැම්බර් මස 6 වන දින හෝ ඊට පසුව විකිණීමෙන් ;".

**7**. 1996 අංක 16 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (කක) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

" (කකක) 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව රන්, මැණික් හෝ ස්වර්ණාභරණ විකිණීමෙන් යම් තැනැත්තකුට උපචිතවන 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ යම් ලාභ සහ ආදායම් ;".

(2) ඒ වගන්තියේ (ප) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

" (පප) යම් සමාගමක් විසින් නිකුත් කරනු ලැබ, යම් තැනැත්තකු විසින් දරනු ලබන්නා වූ ද, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් පළ කරන ලද යම් නිල ලැයිස්තුවක විකිණීම සිදුකරන අවස්ථාව වන විට ලැයිස්තුගත කර ඇත්තා වූ ද, යම් බැඳුම්කරයක්, ණයකරයක් හෝ වෙනත් ණය සාධන පත්‍රයක් ඒ තැනැත්තා විසින් 1997 නොවැම්බර් මස 6 වන දින හෝ ඊට පසුව විකිණීමෙන් ඔහුට උද්ගතවන්නා වූ හෝ උපචිත වන්නා වූ 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ යම් ලාභ සහ ආදායම්;";

(3) ඒ වගන්තියේ (ම) ඡේදයෙහි -

" ගොවිසෙත ලොතරැයියෙන් ලැබෙන ලාභ සහ ආදායම".

යන වචන වෙනුවට " ගොවිසෙත ලොතරැයියෙන් ලැබෙන ලාභ සහ ආදායම, සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (ම) ඡේදයේ අගට පහත දක්වෙන ඡේද එකතුකිරීමෙන් :-

"(ය) ආණ්ඩුව විසින් පිහිටුවන ලද සහ භාර ආඥාපනතේ 114 වගන්තිය යටතේ ලියාපදිංචිකර ඇති සුදු නෙළුම් ව්‍යාපාරය විසින් යම් වාණිජ බැංකුවක තැන්පත් කර ඇති යම් මුදලක් මත සුදු නෙළුම් ව්‍යාපාරයට උපචිත වන යම් පොලියක් හෝ වට්ටමක් ;

(යය) 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව යම් ප්‍රාථමික අලෙවිකරුවකුට උද්ගත වන්නා වූ හෝ උපචිත වන්නා වූ 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ ලාභ සහ ආදායමේ අදළ කොටස.

මේ ඡේදයේ කාර්ය සඳහා -

(i) 'අදළ කොටස' යන යෙදුමෙන් ලාභ සහ ආදායමට හා යම් ප්‍රාථමික අලෙවිකරුවකුට අදළව අදහස් වනුයේ, ඒ ප්‍රාථමික අලෙවිකරු විසින් යම් භාණ්ඩාගාර බිල්පත්‍රයක්, භාණ්ඩාගාර බැඳුම්කරයක්, ලියාපදිංචි කළ ස්කන්ධ හෝ, සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද සහ ඒ ප්‍රාථමික අලෙවිකරු දරන වෙනත් සුරැකුම්පත් ද්විතීය වෙළෙඳපොළෙහි ගනුදෙනු කිරීමෙන් ඒ ප්‍රාථමික අලෙවිකරුට ලැබෙන ලාභවලින් සහ ආදායමින් ඒ බිල්පත්‍රය, බැඳුම්කරය, ස්කන්ධ හෝ වෙනත් සුරැකුම්පත ඒ ප්‍රාථමික අලෙවිකරු විසින් කල් පිරෙන තෙක් දරනු ලැබුවේ නම්, ඒ බිල්පත්‍රය, බැඳුම්කරය, ස්කන්ධ හෝ වෙනත් සුරැකුම්පත ඒ ප්‍රාථමික අලෙවිකරු විසින් දරනු ලැබූ කාලසීමාවට ආරෝපණය කළ හැකි පොලී හෝ වට්ටම් කොටස අඩුකිරීමෙන් පසු ලැබෙන ප්‍රාථමික අලෙවිකරුගේ ලාභ සහ ආදායම ය.

(ii) 'ප්‍රාථමික අලෙවිකරු' යන යෙදුමෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ හෝ ලියාපදිංචි කළ ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ හෝ පත්කරන ලද භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ලියාපදිංචි කළ ස්කන්ධ හෝ වෙනත් සුරැකුම්පත් සම්බන්ධයෙන් ප්‍රාථමික අලෙවිකරුවකු වශයෙන් ක්‍රියා කරන යම් මුදල් ආයෝජකයකු හෝ බැංකුවක් අදහස් වේ".

**8**. 1997 අංක 24 දරන පනතින් ඇතුළත් කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 17 ඒඒ වගන්තියේ (2) වන උපවගන්තිය පහත දක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ආ) (i) තත් කාර්ය සඳහා 1997 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලකින් වූ ඉල්ලීමක් මත 1998 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර,

(ii) තත් කාර්ය සඳහා 1997 දෙසැම්බර් මස 31 වන දිනට පසුව එහෙත් 1999 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලකින් වූ ඉල්ලීමක් මත 2000 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර

ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් මේ වගන්තිය අදළ වන සමාගමක් බවට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ ".;

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඇ) (i) (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ සඳහන් වන සමාගමක් සම්බන්ධයෙන් වන විට 1998 දෙසැම්බර් මස 31 වන දිනට පෙර ; සහ

(ii) (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් වන සමාගමක් සම්බන්ධයෙන් වන විට 2000 දෙසැම්බර් මස 31 වන දිනට පෙර

සමාගමක් විසින් කරගෙන යන ව්‍යවසායේ භාවිතය පිණිස යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ උපකරණ මිලට ගැනීම සඳහා රුපියල් දශ ලක්ෂ හතරකට නොඅඩු මුදලක් ආයෝජනය කර ඇති, ".

**9**. 1997 අංක 24 දරන පනතින් ඇතුළත් කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 17 ඔඔ වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

" (ආ) (i) තත් කාර්ය සඳහා 1997 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර ලියවිල්ලක් මගින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත 1998 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර, නැතහොත්

(ii) තත් කාර්ය සඳහා 1997 දෙසැම්බර් මස 31 දිනට පසු එහෙත් 1999 දෙසැම්බර් මස 31 වන දිනට පෙර ලියවිල්ලක් මගින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත 2000 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර

ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දන්වීමක් මගින් මේ වගන්තිය අදාළ වන ව්‍යවසායයක් බවට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද, සහ ";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

" (ආ) 'අදාළ දිනය ' යන යෙදුමෙන් ඒ යෙදුම -

(i) (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය අනුව අනුමත කරන ලද යම් ව්‍යවසායකට අදාළ වීමේ දී 1996 නොවැම්බර් මාසයට පෙර නොවූ සහ 1998 අප්‍රේල් මාසයට පසුව නොවූ ද යම් ලිත් මාසයක පළමුවන දිනය වූ ද,

(ii) (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදය අනුව අනුමත කරන ලද යම් ව්‍යවසායකට අදාළ වීමේ දී 1997 නොවැම්බර් මාසයට පෙර නොවූ සහ 2000 අප්‍රේල් මාසයට පසුව නොවූ ද යම් ලිත් මාසයක පළමුවන දිනය වූ ද,

ඒ ව්‍යවසාය විසින් තෝරාගනු ලැබ ඒ මාසයේ අන්තිම දින සිට දින තිහක් ඉකුත් වීමට පෙර කොමසාරිස්-ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් දනුම් දෙනු ලැබුවා වූ ද දිනය අදහස් වේ ;

එසේ වුවද අදාළ දිනය එසේ කොමසාරිස් ජනරාල්වරයාට දනුම් දී නොමැති අවස්ථාවක,

(i) (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය අනුව අනුමත කරන ලද යම් ව්‍යවසායකට අදාළ වීමේ දී 1997 අප්‍රේල් මස 1 වන දිනය ;

(ii) (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදය අනුව අනුමත කරන ලද යම් ව්‍යවසායකට අදාළ වීමේ දී 1999 අප්‍රේල් මස 1 වන දිනය ;

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 ඔබ වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් වගන්ති මෙයින් එහි ඇතුළත් කරන අතර ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ පිළිවෙළින් 17 ඕ වගන්තිය සහ 17ක වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :-

" ඇතැම් සේවා සැලැස්වීම පිණිස වූ යම් ව්‍යවසායක ලාභ සහ ආදායම් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

17ඕ. භාණ්ඩ ශීතකරණ තුළ ප්‍රවාහනය කිරීමේ හෝ ශීත කාමරවල ගබඩා කිරීමේ හෝ සේවා හෝ ඊට ආනුෂංගික සේවා සපයනු ලබන යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන යම් ලාභ සහ ආදායම හැර) ලාභ සහ ආදායම-

(අ) 1998 අප්‍රේල් මස 1 වන දින ; හෝ

(ආ) ඒ ව්‍යවසාය ව්‍යාපාර කටයුතු කරගෙන යෑම ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භක දිනය

යන දෙකින් පසුව එළඹෙන දින සිට ගණන් බලන ලද අවුරුදු පහක කාලයක් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

වැවිලි කර්මාන්ත නොවන කෘෂි කාර්මික කටයුතුවල නිරත යම් සමාගමක ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

17ක. (1) (2) වන උපවගන්තියේ සඳහන් කරනු ලබන යම් නිශ්චිත ව්‍යවසායකින් යම් සමාගමකට ලැබෙන, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන යම් ලාභ සහ ආදායම හැර) ලාභ සහ ආදායම -

(අ) 1998 අප්‍රේල් මස 1 වන දින ; හෝ

(ආ) ඒ සමාගම ව්‍යාපාර කටයුතු කරගෙනයාම ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද, ඒ තක්සේරු වර්ෂයේ ආරම්භක දිනය යන දෙකින් පසුව එළඹෙන දින සිට ගණන් බලන ලද අවුරුදු දහයක කාලයක්, 32ඇඇඇඇ වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුවද, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා නිශ්චිත ව්‍යවසාය යන්න, යම් සමාගමක් සම්බන්ධයෙන් යෙදෙන විට ඒ සමාගම විසින් කරගෙන යන්නා වූ ද

(අ) තේ, රබර් සහ පොල් හැර වෙනත් පැල වර්ග ඉඩම්වල වගා කිරීමෙහි ; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් කරන ලද වගාවන් සඳහා උසස් තත්ත්වයේ වැවිලි ද්‍රව්‍ය ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සහතික කරනු ලබන වැවිලි ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමෙහි ; හෝ

(ඇ) (අ) ඡේදයෙහි සඳහන් වගාවන් සඳහා වන වැවිලි ද්‍රව්‍යවල තත්ත්වය සහ ස්වභාවය වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ කටයුතු කිරීමෙහි නිරතව සිටින්නා වූ ද ව්‍යවසායක් වේ.''.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඇ වගන්තියට ඉක්බිතිව ම, පහත දක්වෙන අලුත් වගන්තිය මෙයින් එහි ඇතුළත් කරන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 20 ඇ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :-

" අලුත් හෝ සකස් කළ එළවළු හෝ පලතුරු අපනයනය කරන හෝ එළවළු හෝ පලතුරු වගා- කරන සමාගමක ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

20ඇ. (1) යම් සමාගමක් විසින් (2) වන උපවගන්තියේ සඳහන් වන යම් නිශ්චිත ව්‍යවසායකින් ලබන, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන යම් ලාභ සහ ආදායම් නොවන) ලාභ සහ ආදායම viiiඅ පරිච්ඡේදයේ කුමක් සඳහන් වුව ද -

(අ) 1998 අප්‍රේල් මස 1 වන දින ; හෝ

(ආ) ඒ ව්‍යවසාය ව්‍යාපාරික කටයුතු කරගෙනයාම ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂය ආරම්භක දිනය

යන දෙකින් පසුව එළඹෙන දිනයේ සිට අවුරුදු දහයක කාලයක් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, යම් සමාගමකට සහ යම් තක්සේරු වර්ෂයකට අදාළව 'නිශ්චිත ව්‍යවසාය' යන්නෙන් -

(i) යම් අලුත් හෝ සකස් කළ එළවළු හෝ පලතුරු අපනයනය කිරීමෙහි ; සහ

(ii) ඒ තක්සේරු වර්ෂය තුළ දී ඉඩම් අක්කර පහකට අඩු නොවන ප්‍රමාණයක එළවළු හෝ පලතුරු වගා කිරීමෙහි නිරතව සිටින ඒ සමාගම විසින් කරගෙන යන ව්‍යවසායක් අදහස් වේ.

මේ වගන්තියේ එළවළු යන්නට බුලත් කොළ ඇතුළත් වේ.''.

**12.** 1997 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය තවදුරටත් පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ඉඉ) ඡේදයේ -

(i) " (ඉ) අනුඡේදයේ දැක්වෙන (ii වන අනුඡේදයෙහි සඳහන් පිරියතක්, යන්ත්‍ර හෝ සවිකිරීම නොවන)'' යන වචන වෙනුවට"((ii) වන හෝ (ii අ) අනුඡේදවල සඳහන් පිරියතක්, යන්ත්‍ර හෝ සවිකිරීම නොවන)'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් තැනැත්තකු විසින් අත්කර ගන්නා ලද යම් මෝටර් වාහනයක්, ලොරියක්, බස් රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් හෝ කාර්යාල ගෘහභාණ්ඩ'' යන වචන හා ඉලක්කම් වෙනුවට" 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් තැනැත්තකු විසින් අත්කර ගන්නා ලද (iiඅ) අනුඡේදයේ සඳහන් වන යම් මෝටර් කෝච් රථයක් හැර) යම් මෝටර් වාහනයක්, ලොරියක්, බස්රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් හෝ කාර්යාල ගෘහභාණ්ඩ'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(iii) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :-

" (iiඅ) යම් තැනැත්තකු විසින් 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව අත්කර ගනු ලැබුවා වූ ද ඒ තැනැත්තාගේ සේවා නියුක්තිකයන්ගේ සේවා ස්ථානයට හෝ සේවා ස්ථානයේ සිට ඔවුන් ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරනු ලබන්නා වූ ද යම් මෝටර් කෝච් රථයක් අත්කර ගැනීමේ පිරිවැය මත සියයට සියයක අනුප්‍රමාණය අනුව ;"

(ආ) ඒ උපවගන්තියේ (ක) ඡේදයේ " විශේෂ අයකිරීමක් වශයෙන් ආණ්ඩුවට ගෙවන ලද යම් මුදලක්," යන වචන වෙනුවට " විශේෂ අයකිරීමක් වශයෙන් ආණ්ඩුවට ගෙවන ලද යම් මුදලක් ; සහ ;"

(ඇ) ඒ උපවගන්තියේ (ක) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකු කිරීමෙන් :-

"(ද) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් පළකරනු ලබන යම් නිල ලැයිස්තුවක යම් සමාගමක කොටස් 1999 මාර්තු මස 31 වන දින හෝ ඊට ප්‍රථමයෙන් ලැයිස්තුගත කරවා ගැනීම පිණිස ඒ සමාගම විසින් 1997 නොවැම්බර් මස 6 වන දින හෝ ඉන් පසුව එහෙත් 1999 මාර්තු මස 31 වන දින හෝ ඊට ප්‍රථමයෙන් දරන ලද යම් වියදමක්." ;

(2) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ -

(අ) (ඇ) ඡේදයේ "අදහස් වේ" යන වචන වෙනුවට "යන මෙයින් ඒ ප්‍රාග්ධන වත්කම් බැහැර කිරීම මත 1996 අංක 34 දරන භාණ්ඩ සහ සේවා බදු පනත යටතේ අයකරනු ලැබිය හැකි භාණ්ඩ සහ සේවා බද්දේ ප්‍රමාණය, අවස්ථාවෝචිත පරිදි, ඒ විකුණුම් මිලෙහි හෝ වෙළෙඳ පොල අගයෙහි ඇතුළත් කර තිබුනේ නම්, ඒ බද්දේ ප්‍රමාණය අවස්ථාවෝචිත පරිදි, ඒ විකුණුම් මිලෙහි හෝ වෙළෙඳ පොල අගයෙහි ඇතුළත් කර තිබුනේ නම්, ඒ බද්දේ ප්‍රමාණය අවස්ථාවෝචිත පරිදි, ඒ විකුණුම් මිලෙන් හෝ වෙළෙඳපොල අගයෙන් අඩු කිරීමෙන් පසු, ලැබෙන මුදල අදහස් වේ."

(ආ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ (iii) වන අනුඡේදයේ " වත්කම් අත්කර ගැනීමේ දිනය ලෙස සලකනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට " වත්කම් අත්කර ගැනීමේ දිනය ලෙස සලකනු ලැබිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තියේ (ඊ) ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

" (iv) යම් ප්‍රාග්ධන වත්කමක් අත්කර ගැනීමට හෝ ඉදිකිරීමට හෝ අදාළව ගෙවන ලද යෙදවුම් බද්ද සඳහා බැර ඉල්ලා සිටීම පිණිස 1996 අංක 34 දරන භාණ්ඩ සහ සේවා බදු පනත යටතේ යම් තැනැත්තකුට හිමිකම් තිබෙන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගැනීමේ පිරිවැයෙහි හෝ ඉදි කිරීමේ පිරිවැයෙහි, ඒ යෙදවුම් බද්ද ඇතුළත් කරනු නොලැබිය යුතු ය.".

**13**. 1997 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (ඕ) ඡේදයේ (iii) වන අනුඡේදයේ "බද්දක් හෝ අයකිරීමක් වශයෙන්" යන වචන වෙනුවට" බද්දක් හෝ අයකිරීමක් වශයෙන් සහ" ; යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ඕ) ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :-

(iv ) ඒ තැනැත්තා විසින් කරගෙන යන ලද, 1996 අංක 34 දරන භාණ්ඩ සහ සේවා බදු පනතේ අර්ථානුකූලව වන බදු අයවිය යුතු යම් කටයුත්තක් සම්බන්ධයෙන් ලාභ සහ ආදායම නිශ්චය කරනු ලබන්නේ කවර කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව සඳහා ඒ පනත යටතේ ඒ තැනැත්තාට යෙදවුම් බද්ද සඳහා බැර ඉල්ලා සිටීමට හිමිකම් ඇත්නම් ඒ පනත යටතේ වූ ඒ යෙදවුම් බද්ද වශයෙන්".

**14**. 1997 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි -

(අ) ii (අ) අයිතමයෙහි " (7අ) උපවගන්තියේ සඳහන් අලාභයකින් මේ අනුඡේදයේ (ආ) ඡේදයේ සඳහන් අලාභයකින්," යන වචන හා ඉලක්කම් වෙනුවට " (7අ) උපවගන්තියේ සඳහන් අලාභයකින්, (7ආ) උපවගන්තියේ සඳහන් අලාභයකින් මේ අනුඡේදයේ (ආ) ඡේදයේ සඳහන් අලාභයකින්," යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදයේ අතුරු විධානයේ (iv ) වන අයිතමයෙහි " (7) වන උපවගන්තියේ හෝ (7අ) උපවගන්තියේ සඳහන් " යන වචන හා ඉලක්කම් වෙනුවට " (7) වන උපවගන්තියේ හෝ (7අ) උපවගන්තියේ හෝ (7ආ) උපවගන්තියේ සඳහන් " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ " ඒ මුළු ප්‍රමාණය හෝ කොටස -" යන වචනවල සිට " ආකාරයට අඩු කරනු ලැබිය යුතු ය." යන වචන හා ඉලක්කම් දක්වා වූ කොටස වෙනුවට පහත දක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

" ඒ මුළු ප්‍රමාණය ම හෝ කොටස හෝ ඊළඟට එළඹෙන තක්සේරු වර්ෂයේ ඔහුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කළ යුතු අතර, එසේ කළ නොහැකි විට, ඊළඟට එළඹෙන තක්සේරු වර්ෂයේ මුළු ව්‍යවස්ථාපිත ආදායමින් යනාදී පිළිවෙලට අඩු කළ යුතුය ;

එසේ වුවද, ඒ පළමුවන තක්සේරු වර්ෂය -

(i) 1997 මාර්තු මස 31 වන දිනයෙන් හෝ ඊට ප්‍රථමයෙන් හෝ අවසන් වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, ඒ අලාභය සිදු වූ තක්සේරු වර්ෂයට පසුව එළඹෙන එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව වූ එක් එක් තක්සේරු වර්ෂය සඳහා වූ ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමින් ඒ මුළු ප්‍රමාණය හෝ කොටස අඩු කිරීමෙන් පසු ඉතිරිවන යම් ශේෂයක් වේ නම් ඒ ශේෂය, ඒ තැනැත්තා විසින් ඒ ව්‍යවසායේ දී 1998 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන තක්සේරු වර්ෂය තුළ දී දරන ලද අලාභයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ;

(ii) 1997 අප්‍රේල් මස 1 වන දිනෙන් හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමින් ඒ මුළු ප්‍රමාණය හෝ කොටස අඩුකිරීමෙන් පසු ඉතිරිවන යම් ශේෂයක් වේ නම්, ඒ ශේෂය, ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම වූ තක්සේරු වර්ෂයේ දී ඒ තැනැත්තා විසින් ඒ ව්‍යවසායේ දී දරන ලද අලාභයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ;

එම අලාභය (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන සලසා ඇති ආකාරයට අඩු කරනු ලැබිය යුතු ය.".

(3) ඒ වගන්තියේ (7අ) උපවගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

" (7ආ) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමට යම් කල්බදු ව්‍යාපාරයකින් ලැබූ ලාභ සහ ආදායම ඇතුළත් වන අවස්ථාවක, කල්බදු ව්‍යාපාරයෙන් 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා දරණ ලද්දා වූ ද යම් අලාභයක්, එය ලාභයක් වූයේ නම් මේ පනත යටතේ තක්සේරු කරනු ලැබිය හැකි වූ ද සහ ඔහුගේ කලින් වර්ෂයක මුළු ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කරනු නොලැබුවා වූ ද, නම් ඒ අලාභය සහ ඒ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය හැකි ය ;

එසේ වුව ද ඒ අඩු කිරීම, කවර කරුණක් නිසාවත් ඒ මුළු ව්‍යවස්ථාපිත ආදායමේ ඇතුළත්ව ඇති ඒ ව්‍යාපාරයෙන් ලැබුණු ලාභවල හා ආදායමේ ප්‍රමාණය නොඉක්මවිය යුතු අතර, හැකිතාක් දුරට අලාභය සිදු වූ වර්ෂයට පසුව එළඹෙන පළමුවන තක්සේරු වර්ෂය සඳහා වූ ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩුකරනු ලැබිය යුතු ය ; එසේ කිරීමට නොහැකිවන්නේ නම් ඊළඟට අනුප්‍රාප්තිකව එළඹෙන තක්සේරු වර්ෂය සඳහා වූ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් යන ආකාරයට අඩු කරනු ලැබිය යුතු ය." .

**15**. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ හතරවන අතුරු විධානයේ " 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් " යන වචන හා ඉලක්කම් වෙනුවට " 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එහෙත් 1997 මාර්තු මස 31 වන දිනට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සහ 1997 මාර්තු මස 31 වන දින සිට 1997 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.".

**16**. 1996 අංක 16 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය මෙයින් තවදුරටත් පහත දක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) (ට) ඡේදයේ " ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතුය. " යන වචන වෙනුවට " ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතුය;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ට) ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :-

" (ඩ) ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් පළකරනු ලබන යම් නිල ලැයිස්තුවක 1999 මාර්තු මස 31 වන දින වන විට ස්වකීය කොටස් ලැයිස්තු ගත කරන ලද සමාගමක පවත්නා කොටස් හැර යම් සාමාන්‍ය කොටසක් මිලට ගැනීමෙහිලා යම් පුද්ගලයෙකු විසින් 1997 නොවැම්බර් මස 6 වැනි දින හෝ ඉන් පසුව එහෙත් 1999 අප්‍රේල් මස 1 වැනි දිනට ප්‍රථමයෙන් ආයෝජනය කර ඇති යම් මුදලක් ;

(ණ) (අ) (i) 1997 නොවැම්බර් මස 06 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කරනු ලැබුවා වූ සහ ;

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත් වී සිටින්නා වූ ද,

ඒ ගිවිසුම අනුව ශ්‍රී ලංකාවෙහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායක නිරතවන සිටින්නා වූ ද ;

(ආ) (i) 2000 මාර්තු මස 31 වන දිනට ස්වකීය නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය රුපියල් දශලක්ෂ තුන්සියයකට නොඅඩු වන්නා වූ ද,

(ii) සමාගම විසින් කරගෙන යන ව්‍යවසායේ ප්‍රයෝජනය සඳහා 2000 මාර්තු මස 31 වන දින වන විට -

(අ) යම් ගොඩනැගිල්ලක් මිලට ගැනීමෙහි ලා හෝ ඉදි කිරීමෙහි ලා නැතහොත් යම් ඉඩමක්, පිරියතක්, යන්ත්‍රයක් හෝ ගෘහභාණ්ඩ මිලට ගැනීමෙහි ලා ; සහ

(ආ) (අ) ඡේදයේ ඇතුළත් කර නැති යම් වෙනත් වත්කමක් අත්කර ගැනීමෙහිලා

රුපියල් දශලක්ෂ පන්සියයකට නොඅඩු මුදලක් ආයෝජනය කර ඇත්තා වූ ද යම් සමාගමක පවත්නා යම් කොටසක් හැර යම් සාමාන්‍ය කොටසක් මිලට ගැනීම පිණිස 1997 නොවැම්බර් මස 6 වන දින හෝ ඉන් පසුව එහෙත් 2000 අප්‍රේල් මස 1 වන දිනට ප්‍රථම යම් තැනැත්තකු විසින් ආයෝජනය කරන ලද මුදලක් ;

(ත) (i) 11(අඅඅ) වගන්තියේ සඳහන් වන යම් සමාගමක ; හෝ

(ii) 17 ක වන වගන්තියේ සඳහන් වන යම් සමාගමක ආයෝජනය කරනු ලැබූ මුදල රුපියල් දශලක්ෂ දහයකට නොඅඩුමුදලක් වූයේ නම් සහ එම මුදල එම සමාගම විසින් ඒ වගන්තියේ සඳහන් යම් නිශ්චිත ව්‍යවසායක ප්‍රයෝජනය සඳහා යොදවා ඇති බව තක්සේරුකරු වෙත ඔප්පුකර ඇත්තේ නම්

එම සමාගමේ පවත්නා කොටස් හැර යම් සාමාන්‍ය කොටස් මිලට ගැනීමෙහි ලා යම් තැනැත්තකු විසින් 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2000 මාර්තු මස 1 වන දිනට ප්‍රථම ආයෝජනය කරනු ලබන යම් මුදලක් ;

(2) ඒ වගන්තියේ (5ඉ) උපවගන්තියේ -

(i) (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ " (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක), (ග) සහ (ට) ඡේදවල" යන වචන, අකුරු සහ ඉලක්කම් වෙනුවට 2 වන උපවගන්තියේ (ආ), (ඇ), (ක), (ග), (ට), (ඩ), (ණ) සහ (ත) ඡේදවල)" යන වචන, අකුරු සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) (iii) වන අනුඡේදයේ "රුපියල් විසිපන්දහසක් නොඉක්ම විය යුතුය ; සහ" යන වචන වෙනුවට "රුපියල් විසිපන්දහසක් නොඉක්ම විය යුතුය;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් :-

"(iiiඅ) ඔහු විසින් කරනු ලැබූ හෝ ඔහු විසින් කරනු ලැබුවේ යයි සැලකෙන, (2) වන උපවගන්තියේ (ඩ) ඡේදයෙහි සඳහන් සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන්, ඒ තක්සේරු කළ හැකි ආදායමේ තුනෙන් එකක් නොඉක්ම විය යුතු ය;

(iiiආ) ඔහු විසින් කරනු ලැබූ හෝ ඔහු විසින් කරනු ලැබුවේ යයි සැලකෙන, (2) වන උපවගන්තියේ (ණ) ඡේදයෙහි සඳහන් සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන්, ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එකක් නොඉක්ම විය යුතු ය ; සහ";

(ii) (ආ) ඡේදයේ " (ආ), (ඇ), (ක) සහ (ග) ඡේදවල" යන වචන හා අකුරු වෙනුවට (ආ), (ඇ), (ක), (ග) සහ (ක) ඡේදවල" යන වචන හා අකුරු ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ -

(අ) (i) වන ඡේදයේ " (ග) ඡේදයේ සඳහන් ; හෝ" යන වචන වෙනුවට " (ග) ඡේදයේ සඳහන් ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ii) වන ඡේදයෙහි " (ට) ඡේදයේ සඳහන් " යන වචන වෙනුවට" (ට) ඡේදයේ හෝ (ණ) ඡේදයේ සඳහන් " යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (7අ) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

" (7අඅ) යම් සමාගමක යම් කොටසක් මිලට ගැනීම වෙනුවෙන් (1) වන උපවගන්තිය යටතේ තමාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් දීමනාවක් අඩුකිරීමට හිමිකම් ඇති යම් තැනැත්තකු විසින් ඒ කොටස විකුණා හෝ ඒ කොටස වෙනුවෙන් යම් මුදලක් ආපසු ලබාගෙන හෝ උපලබ්ධ කොටගෙන හෝ ලබාගෙන ඒ උපවගන්තිය යටතේ ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩුකිරීමක් සඳහා ඔහු හිමිකම් ලබන වෙනත් සාමාන්‍ය කොටස් මිලට ගත් අවස්ථාවක, දෙවන වරට සඳහන් කරන ලද කොටස් මිලට ගැනීම වෙනුවෙන් ඔහුගේ ආදායම් බද්දෙන් අඩුකිරීමට ඔහු හිමිකම් ලබන අඩු කිරීමේ ප්‍රමාණයෙන්, පළමුව සඳහන් කරන ලද කොටස් මිලට ගැනීම වෙනුවෙන් ඔහුගේ ආදායම් බද්දෙන් අඩුකිරීමට ඔහු හිමිකම් ලැබූ අඩුකිරීමේ ප්‍රමාණය අඩු කරනු ලැබිය යුතු ය.".

**17.** 1997 අංක 24 දරන පනතින් ඇතුළත් කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

" (i) 1996 නොවැම්බර් මස 6 වන දින හෝ ඉන් පසුව එහෙත් 2000 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව;" ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ " ඒ මුළු සුදුසුකම් ලබන ආයෝජනය යන මේ දෙකෙන් කවර වූ හෝ අඩු මුදල; " යන වචන වෙනුවට " ඒ මුළු ආයෝජන බදු දීමනාව යන මේ දෙකෙන් කවර වූ හෝ අඩු මුදල;" යන වචන ඒ වගන්තියේ, ඒ වචනයෙදී ඇති සෑම තැනකම ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ (ii) වන අනුඡේදයේ "1996 නොවැම්බර් මස 6 වන දිනයෙන් ආරම්භව 1999 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන" යන වචන හා ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් -

"(අ) ඒ වත්කම් 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට ප්‍රථමයෙන් අත්කර ගෙන ඇති හෝ අත්කර ගන්නා ලදැයි සැලකෙන අවස්ථාවක, 1996 නොවැම්බර් මස 6 වන දිනයෙන් ආරම්භව 1999 මාර්තු මස 31 දිනයෙන් අවසන් වන ; හෝ

(ආ) ඒ වත්කම් 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව අත්කර ගෙන ඇති හෝ අත්කර ගන්නා ලදැයි සැලකෙන අවස්ථාවක, 1998 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව 2001 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන ".

**18**. 1996 අංක 16 දරන පනතින් ඇතුළත් කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 32 ඇඇඇ වගන්තියේ අගට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(3) 11 වන වගන්තියේ (අඅඅඅ) ඡේදයේ සඳහන් වන සමාගමක සේවයෙහි නියුක්ත කරනු ලැබූ සහ 67 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ අවුරුදු පහක කාලයක් සඳහා නිර්වාසිකයකු බවට සලකනු ලබන පුද්ගලයකු එම අවුරුදු පහක කාලයෙන් පසුව ද ශ්‍රී ලංකාවෙහි ඒ සමාගමේ අඛණ්ඩව සේවා නියුක්තයෙහි යොදවා සිටින අවස්ථාවක, ඒ අවුරුදු පහක කාල සීමාව අවසානයෙන් ආරම්භව ඒ සමාගම විසින් ගෙවනු ලබන ලාභාංශ ආදායම් බද්දෙන් නිදහස් කර ඇත්තේ කවර කාලසීමාවක් සඳහාද, ඒ කාලසීමාවේ අවසානය තෙක් වූ කාලයක්, සඳහා මේ පනතේ viii වන පරිච්ඡේදයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුන ද ඒ පුද්ගලයාට ඒ සමාගමේ සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ වලින් සියයට පහළොව බැගින් වූ අනුප්‍රමාණය අනුව ආදායම් බද්දක් අය කරනු ලැබිය යුතුය.".

**19**. 1989 අංක 11 දරන පනතින් ඇතුළත් කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියෙහි 32ඇ වගන්තියෙහි (i) වන උපවගන්තියේ " ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලබන" යන වචන වෙනුවට " ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1998 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව දරන ලද " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**20**. 32ඇඇ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියෙහි 32 ඇඇඇ, 32ඇඇඇඇ සහ 32ඇඇඇඇඇ වගන්ති ලෙස බලපැවැත්විය යුතුය :-

"සමාගමක් නොවන තැනැත්තකු විසින් කරගෙන යන ඇතැම් ව්‍යාපාරවල ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය.

32ඇඇඇ (1) 1998 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා (සමාගමක් නොවන) යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායමට යම් කෘෂිකාර්මික ව්‍යවසායකින් හෝ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා වූ යම් ව්‍යවසායකින් ලැබෙන (මෙහි මින් මතු මේ වගන්තියේ "නිශ්චිත ලාභ" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ලාභ සහ ආදායම් ඇතුළත්වන්නේ නම් එකී ලාභ සහ ආදායම්වල (මෙහි මින් මතු මේ වගන්තියේ "ආදායමේ අදාළ කොටස" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් කොටසක් මත ගෙවියයුතු ආදායම් බදු අනුප්‍රමාණය සියයට පහළොව ඉක්මවන අවස්ථාවක, ආදායමේ අදාළ කොටස සම්බන්ධයෙන් ගෙවිය යුතු බද්ද පහත දැක්වෙන ලෙස ගණනය කළ යුතු ය :-

(අ) ආදායමේ අදාළ කොටස ඒ 'නිශ්චිත ලාභවල' ප්‍රමාණය ඉක්මවන්නේ නම් :-

(i) ඒ නිශ්චිත ලාභවල ප්‍රමාණයට සමාන වන ආදායමේ අදාළ කොටස මත ගෙවිය යුතු බද්ද සියයට පහළොව බැගින් වූ අනුප්‍රමාණයක් විය යුතු ය ; තවද

(ii) ආදායමේ අදාළ කොටසේ ශේෂය මත ගෙවිය යුතු බද්ද මේ පනත යටතේ අදාළ කළයුතු පරිදි වූ සියයට පහළොවට වැඩි බදු අනුප්‍රමාණයන් අනුව ගණනය කරනු ලැබිය යුතු ය.

(ආ) ආදායමේ අදාළ කොටස ඒ නිශ්චිත ලාභවල ප්‍රමාණය නොඉක්මවන්නේ නම්, ආදායමේ අදාළ කොටසේ මුළු ප්‍රමාණය මත ගෙවිය යුතු බද්ද, මේ පරිච්ඡේදයේ හෝ viii අ පරිච්ඡේදයේ වෙනත් විධිවිධානවල ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද, සියයට පහළොවක අනුප්‍රමාණය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා -

(අ) "කෘෂිකාර්මික ව්‍යවසාය" යන්නට -

(i) මසුන් ඇල්ලීම;

(ii) කවර වූ හෝ විස්තරයක පැල වර්ගයකින් ඉඩමක් වගා කිරීම; සහ

(iii) කවර වූ විස්තරයක පැල වර්ග වලින් වගා කිරීම සඳහා වූ යම් ව්‍යවසායක් උදෙසා කළමනාකරණ සේවා සැපයීම

සඳහා වූ යම් ව්‍යවසායක් ඇතුළත් වේ ;

(ආ) "සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායක්" යන්නෙන් -

(i) ලංකා සංචාරක මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් හෝටලයක් හෝ ආගන්තුක නිවාසයක් ; හෝ

(ii) ලංකා සංචාරක මණ්ඩලය විසින් 'අ ශ්‍රේණියේ' හෝ 'ආ ශ්‍රේණියේ' ආපනශාලාවක් ලෙස ශ්‍රේණිගත කර ඇති ආපනශාලාවක් ;

(iii) සංචාරක නියෝජිතයකු ගේ යම් ව්‍යාපාරයක් ;

(iv) සංචාරකයන් ප්‍රවාහනය කිරීමේ යම් ව්‍යාපාරයක් ;

(v) සංචාරකයන් උදෙසා විනෝද හෝ ක්‍රීඩා පහසුකම් සලසාදීම සඳහා ලංකා සංචාරක මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් ව්‍යාපාරයක් මෙහෙයවීම සඳහා වූ ව්‍යවසායක් අදහස් වේ.

(ඇ) "යම් කෘෂිකාර්මික ව්‍යවසායක ලාභ සහ ආදායම" යන්නෙන් -

(i) (අ) ඡේදයේ (iii) වන අනුඡේදයේ සඳහන් වන ව්‍යවසායක් සම්බන්ධයෙන් වන විට, කළමනාකරණය සැපයීම සඳහා වන ගාස්තු වලින් ලැබෙන ලාභ සහ ආදායම ; සහ

(ii) අනෙකුත් අවස්ථාවල දී එම ව්‍යවසායේ ඵලදාව, කිසියම් සැදීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියකට භාජනය නොකර විකිණීමෙන් ලැබෙන ලාභ සහ ආදායම අදහස් වේ ;

එසේ වුවද, යම් තැනැත්තකු විසින් නිෂ්පාදනයේ හෝ සෑදීමේ ක්‍රියාවලිය සඳහා ඒ කෘෂිකාර්මික ව්‍යවසායයේ නිෂ්පාදිතය යටත් කිරීමේ යම් ව්‍යවසායක් කරගෙන යන අවස්ථාවක, (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදයේ කාර්ය සඳහා ඒ කෘෂිකාර්මික ව්‍යවසායේ නිෂ්පාදිතය විකිණීමක් යයි සලකනු ලබන විකිණීම සිදු කරන අවස්ථාවේ විවෘත වෙළඳපලේ පැවති මිලට විකුණන ලද සේ සැලකිය යුතු අතර, ඒ කෘෂිකාර්මික ව්‍යවසායේ නිෂ්පාදිතය විකිණීමෙන් ලැබෙන ලාභය ඒ විකිණීමක් යයි සළකනු ලබන විකිණීමෙන් උද්ගත වන ලාභය විය යුතු ය.

සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන ඇතැම් ව්‍යවසායවල ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය.

32ඇඇඇඇ (1) 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් සමාගමක බදු අය කළ හැකි ආදායමට යම් කෘෂිකාර්මික ව්‍යවසායකින් හෝ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායකින් ලැබෙන ලාභ හා ආදායම ඇතුළත් වන අවස්ථාවක, එම බදු අය කළ හැකි ආදායමෙහි ඒ ලාභ හා ආදායම සංයුක්ත වන කොටස සඳහා මේ පරිච්ඡේදයේ හෝ viiiඅ පරිච්ඡේදයේ හෝ ix පරිච්ඡේදයේ හෝ යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇතද, සියයට පහළොවක අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කළ යුතු ය.

32 ඇඇඇඇ වගන්තියට අනුකූලව බදු අයකල ලාභවලින් ගෙවූ ලාභාංශ මත ආදායම් බදු අනුප්‍රමාණය.

(2) (1) වන උප වගන්තියේ කාර්ය සඳහා "කෘෂිකාර්මික ව්‍යවසාය", "සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායක්" සහ "යම් කෘෂිකාර්මික ව්‍යවසායක ලාභ හා ආදායම" යන යෙදුම්වලට 32ඇඇඇ වගන්තියේ පිළිවෙලින් දී ඇති අර්ථම තිබිය ඇත්තේ ය.

32ඇඇඇඇඇ (1) (සමාගමක් නොවන) යම් තැනැත්තකුගේ යම් තක්සේරු වර්ෂයක් සඳහා වන බදු අය කළ හැකි ආදායමට :-

(අ) 32ඇඇඇඇ වගන්තියේ සඳහන් ලාභ හා ආදායමෙන් වන ලාභාංශයක් ඇතුළත් වන අවස්ථාවක; හෝ

(ආ) 32ඇඇඇඇ වගන්තියේ සඳහන් සමාගමකින් කෙළින්ම හෝ අන්තර් සමාගම් එකක් හෝ වැඩි ගණනක් මඟින් හෝ (අ) ඡේදයේ සඳහන් යම් ලාභාංශයකින් ලැබෙන ලාභාංශයක් ඇතුළත් වන අවස්ථාවක, පළමුව සඳහන් ලාභාංශය 32ඇඇඇඇ වගන්තියේ සඳහන් ලාභ හා ආදායම ඇති වූ හෝ උපචිත වූ තක්සේරු වර්ෂයේ දී හෝ එම තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ දෙකක් ඇතුළත හෝ ගෙවනු ලැබුවහොත් ද (මේ වගන්තියේ මෙහි මින් මතු "ආදායමේ අදළ කොටස" යනුවෙන් සඳහන් කරනු ලබන) ආදායමේ කොටසක් මත ගෙවිය යුතු ආදායම් බදු අනුප්‍රමාණය සියයට පහළොවට වැඩි වන්නේ නම් එවිට අදළ කොටස සම්බන්ධයෙන් වූ බද්ද පහත දක්වෙන ආකාරයට ගණන් බැලිය යුතු ය.

(i) ආදායමේ අදළ කොටස එම ලාභාංශවල ගණන ඉක්මවන්නේ නම් -

ලාභාංශවල ගණනට සමාන ආදායමේ අදළ කොටස මත ගෙවිය යුතු ආදායම් බද්ද සියයට පහලොව බැගින් වූ අනුප්‍රමාණය අනුව විය යුතු ය; සහ

ආදායමේ අදළ කොටසේ ශේෂය මත ගෙවිය යුතු බද්ද මේ පනත යටතේ අදළ කළ හැකි වූ ද සියයට පහළොවේ අනුප්‍රමාණයට වැඩි වූ ද අනුප්‍රමාණ මත ගණන් බැලිය යුතු ය;

(ii) ආදායමේ අදළ කොටස එම ලාභාංශයේ ගණන නොඉක්මවන්නේ නම්, ආදායම් අදළ කොටසේ සමස්තය මත ගෙවිය යුතු බද්ද මේ පරිච්ඡේදයේ හෝ වෙනත් විධිවිධානවල viii අ පරිච්ඡේදයේ කුමක් පටහැනිව සඳහන්ව ඇත ද සියයට පහළොවක අනුප්‍රමාණය අනුව විය යුතු ය.

(2) යම් සමාගමක බදු අයකළ හැකි ආදායමට (1) වන උපවගන්තියේ සඳහන් යම් ලාභාංශයක් ඇතුළත් වන අවස්ථාවක ඒ ලාභාංශය සංයුක්ත වන ඒ බදු අය කළ හැකි ආදායමේ කොටසට අදළ කළ හැකි ආදායම් බදු අනුප්‍රමාණය 35 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සියයට පහළොවක් විය යුතු ය.".

**21**. පහත දක්වෙන අලුත් වගන්ති 32 ඉඉඉ වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉඉඉඉ හා 32 ඉඉඉඉඉ වගන්ති ලෙස බලපැවැත්විය යුතුය :-

"ඇතැම් කොන්දේසි යටතේ යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක් විසින් ගෙවිය යුතු බද්ද අඩු කිරීම.

32ඉඉඉඉ. (1) 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා, (2) වන උපවගන්තියේ සඳහන් යම් සමාගමක බදු අය කළහැකි ආදායමට 3 (අ) වගන්තියේ අර්ථානුකූලව වන යම් ලාභ හා ආදායම් ඇතුළත් වන අවස්ථාවක, එම තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු බද්දෙන්, එම ලාභ සහ ආදායම සංයුක්ත වන එම බදු අය කළ හැකි ආදායමෙන් 5% කට සමාන මුදලක් අඩු කළ යුතු ය ;

එසේ වුවද එසේ අඩු කළ හැකි මුදල ඒ තක්සේරු වර්ෂය සඳහා එම සමාගම විසින් ගෙවිය යුතු බද්ද ඉක්මවන අවස්ථාවක, අතිරික්තය ආපසු ගෙවනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ විධිවිධාන පහත දක්වෙන ආකාරයේ යම් සමාගමකට, එනම් :-

(අ) එකී තකසේරු වර්ෂය සඳහා නිල ලැයිස්තුගත පොදු සමාගමක් වන සමාගමකට ; සහ

(ආ) සමාගමේ කොටස් හිමියන් වශයෙන් එම සමාගමේ කොටස් ලේඛනයේ ලියාපදිංචි කර ඇති තැනැත්තන් සංඛ්‍යාව එම තක්සේරු වර්ෂයේ කිසිම අවස්ථාවක තුන්සියයකට නොඅඩු සමාගමක් ; බවට තක්සේරුකරු සෑහීමකට පත් වන යම් සමාගමකට අදාළ විය යුතු ය.

(3) යම් සමාගමක් -

(අ) 1997 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා නිල ලැයිස්තුගත පොදු සමාගමක් වන සමාගමක් වන්නේ ද ; සහ

(ආ) 1998 මාර්තු මස 31 වන දින වනවිට එම සමාගමේ කොටස් හිමියන් වශයෙන් එම සමාගමේ කොටස් ලේඛනයේ ලියාපදිංචි කර ඇති තැනැත්තන් සංඛ්‍යාව තුන්සියයකට නොඅඩු බවට තක්සේරුකරු සෑහීමකට පත්වන්නේ නම්.

එවිට (1) වන උපවගන්තියේ සඳහන් අඩු කිරීම 1997 අප්‍රේල් මස 1 වන දින ආරම්භවන තක්සේරු වර්ෂය සඳහා එකී කොටසෙන් සියයට දෙකහමාරකට සමාන ලෙස ඒ සමාගමට අදාළවිය යුතු ය.

32 ඉඉඉඉ (1) 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා (2) වන උපවගන්තියේ සඳහන් යම් සමාගමක බදු අය කළ හැකි ආදයමට 3(අ) වගන්තියේ අර්ථානුකූලව යම් ලාභ සහ ආදයම ඇතුළත් වන අවස්ථාවක එම සමාගම විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු බද්දෙන්, එම ලාභ සහ ආදයම සංයුක්ත වන ඒ බදු අය කළ හැකි ආදයමේ කොටසින් සියයට පහකට සමාන ගනනක් අඩු කළ යුතු ය ;

එසේ වුවද එසේ අඩු කළ හැකි මුදල ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු බද්ද ඉක්මවන අවස්ථාවක, අතිරික්තය ආපසු නොගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන, එම උපවගන්තියේ සඳහන් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් වන විට පහත දක්වෙන පරිදි යම් සමාගමකට අදාළ විය යුතුය :-

(අ) එම තක්සේරු වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් අනුව ශ්‍රී ලංකා සුරැකුම් පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර නිකුත් කරන ලද යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් පළ කරනු ලබන යම් නිල ලැයිස්තුවක එම තක්සේරු වර්ෂයේ මාර්තු මස 31 වන දින වන විට කොටස් නිල ලැයිස්තුගත කර ඇති සමාගමක් ;

(ආ) එම තක්සේරු වර්ෂයේ මාර්තු මස 31 වන දින වන විට -

(i) එම සමාගමේ කොටස් හිමියන් වශයෙන් එම සමාගමේ කොටස් ලේඛනයේ ලියාපදිංචිකර ඇති තැනැත්තන් සංඛ්‍යාව, එම තක්සේරු වර්ෂයේ කිසිම අවස්ථාවක තුන්සියයට අඩු නොවන බවට තක්සේරුකරු සෑහීමකට පත් වන්නේ නම් එවැනි සමාගමක් ;

(3) යම් සමාගමක් සම්බන්ධයෙන් වන විට -

(අ) 1998 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර ඒ සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර නිකුත් කරන ලද යම් කොටස් හුවමාරු පොළක් විසින් පළ කරනු ලබන යම් නිල ලැයිස්තුවක 1999 මාර්තු මස 31 වන දින වන විට එකී කොටස් නිල ලැයිස්තුගත කර ඇත්නම්; සහ

(ආ) 1998 මාර්තු මස 31 වන දින වන විට එම සමාගමේ කොටස් හිමියන් වශයෙන් එම සමාගමේ කොටස් ලේඛනයේ ලියාපදිංචි කර ඇති තැනැත්තන් සංඛ්‍යාව, කිසිම අවස්ථාවක තුන්සීයයකට අඩු නොවන බවට;

තක්සේරුකරු සෑහීමකට පත්වන්නේ නම්, (1) වන උපවගන්තියේ සඳහන් අඩු කිරීම, 1997 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා එකී කොටසින් සියයට දෙකහමාරකට සමාන ලෙස, ඒ සමාගමට අදළ විය යුතු ය;''.

**22**. 1997 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 33අ වගන්තියේ (2) වන උපවගන්තියේ (ii) වන ඡේදයේ '32ඊ වගන්තිය හෝ 32ඌ වගන්තිය' යන වචන හා ඉලක්කම් වෙනුවට '32 ඇඇඇඇ වගන්තිය හෝ 32ඊ වගන්තිය හෝ 32 ඌ වගන්තිය' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**23**. 1996 අංක 16 දරන පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 33ඇ වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (i) වන ඡේදයේ (ඇ) අනුඡේදයේ -

(අ) (i) වන අයිතමයට ඉක්බිතිව ම පහත දක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන් :-

" (iඅ) සියයට පනස් හතර බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ" ; සහ

(ආ) (ivඅ) සහ "(ivආ) වන අයිතම ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ආදේශ කිරීමෙන් :-

" (v) සියයට දහත බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවනු ලැබ අත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ ;

(vi) සියයට එකොලහ බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ ;

(vii) සියයට අට බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ ;

(viii) සියයට පහ බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ ; ",

(2) එම වගන්තියේ (2) වන ඡේදයේ (ආ) අනුඡේදයේ (iii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන් :-

" (iiiඅ) 32 ඇඇඇඇ වගන්තිය යටතේ ".

**24**. 1996 අංක 16 දරන පනතින් සංශෝධිත වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ, (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම ඡේදයේ (i) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන් :-

" (iඅ) සියයට පනස්හතර බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ ; " ;

(2) එම ඡේදයේ (iv අ) සහ (iv ඇ) අයිතම ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන්:-

" (ivඅ) සියයට දහත බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ ;

(ivආ) සියයට එකොලහ බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ ;

(ivඇ) සියයට අට බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ ;

(ivඈ) සියයට පහ බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ" .

**25**. ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තිය අගට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(9) මේ වගන්තියේ කාර්යයන් සඳහා 'ලේඛනය' යන යෙදුමට යම් පරිගණක වැඩ සටහනක් හෝ දත්ත සංකේතාකාරයෙන් හෝ විද්‍යුත්, කාන්දම් හෝ වෙනත් මාධ්‍යයකින් ගබඩා කර ඇති හෝ සටහන් කර ඇති යම් ඩිස්කටයක්, පටියක්, සුසංහිත ඩිස්කයක් වෙනත් යම් දෙයක් ඇතුළත් වේ" .

**26**. ප්‍රධාන ප්‍රඥප්තියේ 108 වන වගන්තියේ (1) වන උපවගන්තිය " ඒ සේවා යෝජකට නියමකළ යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

" ඒ සේවා යෝජකට කියම කළ යුතු ය :

එසේ වුව ද තක්සේරුකරුගේ මතය අනුව, යම් තක්සේරු වර්ෂයක දී යම් සේවායෝජකයකු විසින් අඩුකරගත යුතු යම් ආදායම් බද්දක් සම්බන්ධයෙන් එම සේවායෝජකයා විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ යම් වංචාවක් මගහැරීමක් හෝ වුවමනාවෙන්ම පැහැර හැරීමක් කර ඇති අවස්ථාවක, එම තක්සේරු වර්ෂයේ අවසානයට පසුව යම් කිසි අවස්ථාවක, තක්සේරුකරු විසින් එම සේවායෝජකයා සම්බන්ධයෙන් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කිරීම නිත්‍යානුකූල වන්නේ ය." .

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඊ වගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන වෙනුවට පහත දක්වෙන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

" තක්සේරුකරුගේ මතය අනුව, එම තක්සේරු වර්ෂය සඳහා එම බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් අඩු කර කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු වූ ආදායම් බදු මුදල හෝ අතිරේක ආදායම් බදු මුදල ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත යම් අවස්ථාවක දී තක්සේරු කරනු ලැබිය හැකි අතර, 113 ඌ වගන්තිය යටතේ අයවීමට තිබිය හැකි යම් මුදලක් සමඟ ඒ මුදල නොපමාව ගෙවන ලෙස ඒ බැංකුවට හෝ මූල්‍ය ආයතනයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් නියම කළ හැකි ය ;

එසේ වුව ද තක්සේරුකරුගේ මතය අනුව, යම් තක්සේරු වර්ෂයක දී එම බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් අඩුකරගත යුතු යම් ආදායම් බද්දක් සම්බන්ධයෙන් එම බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් හෝ එය වෙනුවෙන් හෝ යම් වංචාවක්, මගහැරීමක් හෝ චුවමනාවෙන්ම පැහැර හැරීමක් කර ඇති අවස්ථාවක, එම තක්සේරු වර්ෂයේ අවසානයට පසුව යම් කිසි අවස්ථාවක, තක්සේරුකරු විසින් එම බැංකුව හෝ මූල්‍ය ආයතනය සම්බන්ධයෙන් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කිරීම නීත්‍යනුකූල වන්නේ ය" .

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර සහ ඒ වෙනුවට පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

" (3) මණ්ඩලය නීති උපදේශකයන් තුන් දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වන මූල මණ්ඩලයක් තිබිය යුතු අතර ඔවුන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය." .

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 161 වන වගන්තියේ (7) වන උපවගන්තිය "භාණ්ඩය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"ලේඛනය" යන්නට යම් පරිගණක වැඩසටහනක් හෝ දත්ත සංකේතාකාරයෙන් හෝ විද්‍යුත්, කාන්දම් හෝ වෙනත් මාධ්‍යයකින් ගබඩා කර ඇති හෝ සටහන් කර ඇති යම් ඩිස්කටයක්, පටියක්, සුසංගත ඩිස්කටයක් හෝ එවැනි ; වෙනත් යම් දෙයක් ඇතුළත් වේ ;' .

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 161අ වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඇඇ) එවැනි යම් ගොඩනැගිල්ලක තිබී හමුවන යම් පරිගණකයක් ක්‍රියාත්මක කිරීම සහ එහි වාර්තා කර ඇති හෝ ගබඩා කර ඇති සටහන්වල මුළුමණින්ම හෝ එහි කොටසක මුද්‍රිත ගැනීම ;" ;

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ "භාණ්ඩය" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"භාණ්ඩය" සහ "ලේඛනය" යන යෙදුම්වලට 161 වන වගන්තියෙන් දී ඇති අර්ථම ඇත්තේය.

**31.** 1995 අංක 27 දරන පනතින් සංශෝධිත වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ "සුදුසුකම් ලබන බෙදාහැරීම" යන්නෙහි අර්ථ කථනයේ ආ ඡේදය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම ඡේදයේ (i) වන අනුඡේදයේ (ආ) අයිතමයෙහි "පළකරන ලද නියෝගයක සඳහන් උචිත අනුප්‍රමාණය අනුව ; හෝ " ; යන වචන වෙනුවට "පළ කරන ලද නියෝගයක සඳහන් උචිත අනු ප්‍රමාණ සියයට දහයක් හෝ සියයට පහළොවක් හෝ සියයට තිස්පහක් ; හෝ " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම අර්ථ කථනයේ -

" (ii) 32ඊ වගන්තියේ හෝ 32ඌ වගන්තියේ " යන වචනවල සිට එම අර්ථ කථනයේ අවසානය දක්වා ඇති සියලු වචන හා ඉලක්කම් වෙනුවට පහත දක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :-

" (ii) 32ඊ වන වගන්තියේ හෝ 32උ වගන්තියේ හෝ 32ඔ වගන්තියේ හෝ 32ක වගන්තියේ හෝ 32ග වගන්තියේ හෝ 32ඇඇඇඇ වගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අයකරනු ලැබිය හැකි ලාභ;

එනමුත් පහත දක්වෙන යම් ලාභාංශයක් ඊට ඇතුළත් නොවේ :-

(අ) පහත සඳහන් දෙයින් බෙද හරින ලද ලාභාංශ :-

(i) 1998 අප්‍රේල් මස 1 වන දිනට පෙර එම සමාගමට උපචිත වූ හෝ පැනනැගුණු ලාභ හෝ ආදයමින් ;

(ii) එහි බද්දෙන් නිදහස් ලාභ හෝ ආදයමින් ;

(iii) එම සමාගමට ලැබුණු ලාභාංශයකින් වන යම් ආදයමකින් ;

(iv) ශ්‍රී ලංකාවෙන් පිටත යම් දේශයකින් යම් සමාගමකට උත්ගත වූ හෝ උපචිත වූ හෝ එය විසින් ලබාගත් හෝ යම් ලාභ සහ ආදායමක් මත මෙම පනතේ 33(1) (අ) වගන්තිය යටතේ ගෙවිය යුතු වන ආදායම බද්දට ප්‍රතිපක්ෂව එකී ලාභ සහ ආදායම මත ඒ වෙනත් පිටත දේශයේ දී එකී සමාගම විසින් ගෙවිය යුතු වන ආදායම් බද්දක් සඳහා 82 වන වගන්තියේ සඳහන් යම් ගිවිසුමක් යටතේ, බැර ලබාගැනීමට හිමිකමක් තිබේ නම් එම ලාභා සහ ආදයමින් ;

(v) 11(අඅඅඅ) වගන්තියේ සඳහන් සමාගමක ලාභ සහ ආදායමින් ගෙවන ලාභාංශ බද්දෙන් නිදහස් වන කාලයේ ලාභ සහ ආදායමින් '';

(ආ) 8 වන වගන්තියේ (අ) ඡේදය යටතේ ලාභ හා ආදයම බද්දෙන් නිදහස් වන යම් තැනැත්තකුට ගෙවන ලද යම් ලාභාංශයක් ;

(ඇ) නිර්වාසිකයකුවන තැනැත්තකුට 1998 අප්‍රේල් මස 1 වන දිනට හෝ ඊට පසු ගෙවන ලද යම් ලාභාංශයක්,''

**32**. ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනයේ '' ආදායම් බද්ද අඩු කිරීමේ අනුප්‍රමාණය සියයට 33 1/3 '' යන වචන හා ඉලක්කම් වෙනුවට පහත දක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

'' ආදායම් බද්ද අඩු කිරීමේ අනුප්‍රමාණය පහත දැක්වෙන පරිදි විය යුතුය :-

1998 අප්‍රේල් මස 1 වන දිනට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 33 1/3

1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 20.''.

**33**. 1997 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය පහත දක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) '' 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දක්වෙන පරිදි විය යුතුය'' යන වචන හා ඉලක්කම් වෙනුවට '' 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන එහෙත් 1998 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දක්වෙන පරිදි විය යුතු ය; ''; යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ද ;

(2) එම උපලේඛනයේ අවසානයට පහත දක්වෙන කොටස එකතු කිරීමෙන් :-

'' 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දකවෙන පරිදි විය යුතුය :-

(i) නිල ලැයිස්තුගත පොදු සමාගමක් විසින් කරනු ලබන්නා වූ

(අ) (32ඊ) වගන්තියේ හෝ 32උ වගන්තියේ හෝ 32ඔ වගන්තියේ හෝ 32ක වගන්තියේ හෝ 32ග වගන්තියේ හෝ 32ඇඇඇඇ වගන්තියේ හෝ විධිවිධානවලට අනුව හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ සාදන ලද යම් නියෝගයක නිශ්චිතව සඳහන් අනු ප්‍රමාණයක් අනුව බදු අයකරනු ලබන්නා වූ ලාභ නොවන ලාභවලින් වන්නා වූ සෑම සුදුසුකම් ලබන බෙද හැරීමක මුදලට සමාන මුදල මත.

සියයට 54

(ආ) 32උෟ වගන්තියේ හෝ 32ඔ වගන්තියේ හෝ 32ක වගන්තියේ හෝ 32ග වගන්තියේ හෝ 32ඇඇඇඇ වගන්තියේ විධිවිධානවලට අනුකූලව හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ සාදන ලද යම් නියෝගයක නිශ්චිතව සඳහන් පරිදි සියයට පහලොවක් වූ එකී සමාගමට අදළ අනුප්‍රමාණ අනුව බදු අයකරනු ලබන ලාභ වලින් වන්නා වූ සෑම සුදුසුකම් ලබන බෙදහැරීමක මුදලට සමාන මුදල මත

සියයට 17

(ඇ) 32ඊ වගන්තියේ විධිවිධානවලට අනුකූලව හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ සාදන ලද යම් නියෝගයක නිශ්චිතව සඳහන් පරිදි සියයට දහයක වූ එම සමාගමට අදළ කළහැකි අනුප්‍රමාණ අනුව බදු අයකරනු ලබන ලාභ වලින් වන්නා වූ සෑම සුදුසුකම් ලබන බෙදහැරීමක මුදලට සමාන මුදල මත

සියයට 11

(ii) ඒකක භාරයක් විසින් හෝ අන්‍යොන්‍ය අරමුදලක් විසින් හෝ නිල ලැයිස්තුගත පොදු සමාගමක් නොවන වෙනත් යම් සමාගමක් විසින් හෝ කරනු ලබන්නා වූ -

(අ) (32ඊ වගන්තියේ හෝ 32උෟ වගන්තියේ හෝ 32ඔ වගන්තියේ හෝ 32ක වගන්තියේ හෝ 32ග වගන්තියේ හෝ 32ඇඇඇඇ වගන්තියේ විධිවිධානවලට අනුව හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ සාදන ලද යම් නියෝගයක නිශ්චිතව සඳහන් අනුප්‍රමාණයක් අනුව බදු අයකරනු ලබන ලාභ නොවන) ලාභ වන්නා වූ සෑම සුදුසුකම් ලබන බෙද හැරීමක මුදලට සමාන මුදල මත

සියයට 27

(ආ) 32උෟ වගන්තියේ හෝ 32ඩ වගන්තියේ හෝ 32ක වගන්තියේ හෝ 32ග වගන්තියේ හෝ 32ඇඇඇඇ වගන්තියේ විධිවිධානවලට අනුකූලව හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ සාදන ලද යම් නියෝගයක නිශ්චිතව සඳහන් සියයට පහලොවක්වන එම සමාගමට අදළ කළහැකි අනුප්‍රමාන අනුව බදු අයකරනු ලබන ලාභ වලින් වන්නා වූ සෑම සුදුසුකම් ලබන බෙද හැරීමක මුදලට සමාන මුදල මත

සියයට 8

(ඇ) 32ඊ වගන්තියේ විධිවිධානවලට අනුකූලව හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත යටතේ සාදන ලද යම් නියෝගයක නිශ්චිතව සඳහන් සියයට දහයක් වන එම සමාගමට අදළ කළ හැකි අනුප්‍රමාණ අනුව බදු අය කළ හැකි ලාභ වලින්, වන්නා වූ සෑම සුදුසුකම් ලබන බෙදහැරීමක මුදලට සමාන මුදල මත

සියයට 5''.

**34**. (1) මේ පනතේ 2(2) සහ 2(3) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 1996 දෙසැම්බර් මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 17(2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තියට කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 1996 නොවැම්බර් මස 6 වන දින ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 14 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියට කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 1997 අප්‍රේල් මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ 21 වන වගන්තියේ විධිවිධාන සියලු කාර්ය සඳහා 1997 අප්‍රේල් මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

(5) (i) මේ පනතේ 3(2) සිට 3 (4) දක්වා වූ වගන්ති වලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියට කරන ලද සංශෝධනය ;

(ii) මේ පනතේ 6 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියට කරන ලද සංශෝධනය;

(iii) මේ පනතේ 8 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඒඒ වගන්තියට කරන ලද සංශෝධනය;

(iv) මේ පනතේ 9 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඔඔ වගන්තියට කරන ලද සංශෝධනය;

(v) මේ පනතේ 12(1) (ආ) වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට කරන ලද සංශෝධනය;

(vi) 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ඡේද ඇතුළත් කිරීම හැර පනතේ 16 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියට කරන ලද සංශෝධනය ;

සියලු කාර්ය සඳහා 1997 නොවැම්බර් මස 6 වන දින ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මේ පනතේ පිළිවෙලින් 2(1), 15 සහ 19 වන වගන්ති වලින් පිළිවෙලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8, 30 සහ 32ඇ වන වගන්තිවලට කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 1998 ජනවාරි මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) (i) මේ පනතේ 4 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට කරන ලද සංශෝධනය ;

(ii) මේ පනතේ 7 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට කරන ලද සංශෝධනය ;

(iii) මේ පනතේ 11 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඇ වන වගන්තියට කරන ලද සංශෝධනය ;

(iv) මේ පනතේ 12 වන වගන්තියෙන් ((1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේද වලින් හැර) ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට කරන ලද සංශෝධනය ;

(v) මේ පනතේ 13 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට කරන ලද සංශෝධනය ;

(vi) මේ පනතේ 17 (1) සහ 17(3) වන වගන්ති වලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තියට කරන ලද සංශෝධනය

(vii) මේ පනතේ 31 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියට කරන ලද සංශෝධනය

(viii) මේ පනතේ පිළිවෙලින් 32 වන සහ 33 වන වගන්ති වලින් 6 වන උපලේඛනයට සහ 7 වන උපලේඛනයට කරන ලද සංශෝධනය,

සියලු කාර්ය සඳහා 1998 අප්‍රේල් මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

(8) මේ පනතේ 20 වන වගන්තියේ විධිවිධාන 1998 අප්‍රේල් මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

**35.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1998 අංක 61 දරන විසර්ජන පනත

[ සහතිකය සටහන් කළේ 1998 දෙසැම්බර් මස 22 වන දින ]

**1999 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ද, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට සැලසීම සඳහා ද ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කරුණු හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1998 අංක 61 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) යම් වියදමකට බලය දෙන්නා වූ වෙන යම් නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි "1999 මුදල් වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන 1999 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 1999 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි ඇස්තමේන්තු කර ඇති රුපියල් විසිහතර දහස් දෙසිය හැට අට කෝටි අනූ දෙලක්ෂ එකොළොස් දහසක් විය යුතු ආණ්ඩුවේ වියදම —

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින් ; හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් නව දහස් හත්සිය දෙකෝටි හැත්තෑ ලක්ෂය නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින් පියවිය යුතු ය. මෙහි ඉහත සඳහන් කළ රුපියල් විසිහතර දහස් දෙසිය හැට අට කෝටි අනූ දෙලක්ෂ එකොළොස් දහසක් වූ මුදල, මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන වෙන යම් ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බලපැවැත්විය යුතු ය.

3. (1) 1999 මුදල් වර්ෂය තුළ දී, මේ පනතෙහි දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්, ඒ කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැර කතරනු ලැබූ ලැබීම්වල එකතුව, ඒ උපලේඛනයේ III වන තීරයෙහි අනුරූපී සටහනෙහි දක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතු ය. ඒ කටයුත්තෙන් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම්, එය 1999 මුදල් වර්ෂය අවසන් වී හය මාසයක් ඉකුත්වීමට පෙර ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය.

(2) (1) උපවගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිශ්චය කිරීමේ කාර්යය සඳහා, පහත දක්වෙන ගෙවීම්, එනම් :-

(අ) යම් කටයුත්තක ආදයමට අයවිය යුතුව, නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ හෝ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපන හා වෙනත් වියදම් ; සහ

(ආ) යම් කටයුත්තක චංචල හා නිශ්චල දේපළ ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන

ඒ එක් එක් කටයුත්තේ ආදායමින් අඩු කළ යුතු ය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 1999 මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම, ඒ මුදල් වර්ෂය තුළ දී ඒ කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම් වලින් ගෙවිය යුතු ය. එහෙත් ඒ වියදම් ඒ උපලේඛනයේ II වන තීරයෙහි අනුරූපි සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

(4) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන යම් කටයුත්තක් සම්බන්ධයෙන් 1999 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, ඒ උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූපී සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය. තවද, ඒ මුදල් වර්ෂය අවසානයේ දී ඒ කටයුත්තේ මුළු බැරකම්, ඒ උපලේඛනයේ V වන තීරයෙහි අනුරූපී සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

**4**. 1999 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක, මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුව ලබන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, ඒ වියදම් පියවීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන මුදල්, ඒකාබද්ධ අරමුදලෙන් හෝ, ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකි ය. එසේ වුවද, එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල එකතුව ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූපී සටහනේ දක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතු ය. ඒ කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

**5**. (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට ඒ උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්ද වූ හෝ මතුවට වියදම් නොකරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද මුදල් කිසිවක්, ඒ වැඩ සටහනේම මූලධන වියදමේ මුදල් වෙන් කිරීමකට හෝ ඒ ශීර්ෂයේම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ මුදල් වෙන් කිරීමකට හෝ, භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකි ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ මුදල් වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතු ය.

**6**. (i) බලය දෙනු ලැබූ වියදම දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩු විය හැකි බවට ; හෝ

(ii) යම් විශේෂ කාර්යයක් හෝ කාර්ය සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට

අමාත්‍යවරයා සෑහීමකට පත් වන අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදා හරින ලද මුදල් සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ ඉවත් කර ගැනීම, අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකි ය.

**7**. (1) අමාත්‍යවරයා විසින්, ආණ්ඩුවේ අනුමතය ඇතිව -

(අ) මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයෙහි, IV වන තීරයෙහි සහ V වන තීරයෙහි දක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක් ;

(ආ) මේ පනතේ දෙවන උපලේඛනයේ III වන තීරයෙහි දක්වෙන අවම සීමා

නියමයක් මගින්, 2000 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර වෙනස් කිරීම හෝ අවුලු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් එය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද, ඒ දිනයට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යයි එහි ප්‍රකාශිතව ම සඳහන් වන්නේ නම්, එසේ ප්‍රකාශිතව සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

8. පාර්ලිමේන්තුව විසින්, යෝජනා සම්මතයක් මගින්, මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරුවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ —

(අ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් ;

(ආ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව,

එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකි ය.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම්බ අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1998 අංක 63 දරන විසර්ජන (සංශෝධන) පනත

[ සහතිකය සටහන් කළේ 1998 දෙසැම්බර් මස 28 වන දින ]

## 1997 අංක 36 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** මේ පනත 1998 අංක 63 දරන විසර්ජන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** 1997 අංක 36 දරන විසර්ජන පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "රුපියල් එකොළොස් දහස් තුන්සිය අටකෝටි අනූ ලක්ෂයක්" යන වචන වෙනුවට "රුපියල් දෙළොස් දහස් හයසිය කෝටියක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 වන ව්‍යවස්ථාව යටතේ සටහන

අමාත්‍ය මණ්ඩලයේ අදහස අනුව, ඉහත සඳහන් පනත් කෙටුම්පත ජාතියේ හිත පිණිස වහා අවශ්‍ය බව අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත.